2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂ අංකය : 233

නො. 31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල
www.analyst.gov.lk
govanalyst@sltnet.lk

පී.එස්.කේ. රාජපක්ෂ
ආණ්ඩුවේ රස පරීක්ෂක

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික තොරතුරු

1.1 හැඳින්වීම
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු
1.3 ප්‍රධාන කාර්යයන්
1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ
1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති විස්තර

පරිච්ඡේදය 02 - දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය

පරිච්ඡේදය 03 – 2024/12/31 දිනට සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
3.4 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම
3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය
3.9 විගණකාධිපති වාර්තාව

පරිච්ඡේදය 04 - කාර්යසාධන ඉලක්ක

පරිච්ඡේදය 05 - සුහුරු සංවර්ධන ඉලක්ක

පරිච්ඡේදය 06 - මානව සම්පත් කළමනාකරණය

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය
6.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත
6.3 මානව සම්පත් කළමනාකරණය

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය

ආයතනික තොරතුරු

1.1 හැඳින්වීම

වර්ෂ 1904 සැප්තැම්බර් මාසයේ ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව එක් නිලධාරියෙකු සමඟ ආරම්භ කරනු ලැබූ ආණ්ඩුවේ රස පරීක්ෂක ආයතනයේ ප්‍රථම රස පරීක්ෂකවරයා ලෙස බ්‍රිතාන්‍ය ජාතික කේ. සී බ්‍රවුනින් මහතා ඉතිහාසයට එක්වේ.

ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව පැවති මෙම ආයතනය වර්ෂ 1913දී රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත විය. දෙපාර්තමේන්තුවක් ලෙස විකාශනය වෙමින් පැවැති මෙම ආයතනය, වර්ෂ 1934 දී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පැවැති ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කරන ලදී.

ආරම්භයේ සිටම විදේශීය ප්‍රධානීන් යටතේ පැවැති මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික රස පරීක්ෂකවරයා ලෙස ඩබ්.ආර් චන්මුගම් මහතා 1945 දී පත්විය. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යයන් පුළුල් කරමින් 1935දී සැක කටයුතු ලේඛණ පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර 1940දී ප්‍රථම සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස තම්බයියා නාගේන්ද්‍රන් මහතා පත්විය.

වර්ෂ 1960දී ආරක්ෂක අමාත්‍යාංශය යටතේත්, 1978 දී අධිකරණ අමාත්‍යාංශය යටතේත් ක්‍රියාත්මක වෙමින් පැවැති මෙහි ප්‍රථම කාන්තා රස පරීක්ෂකවරිය ලෙස 1993 දී යෝගරාණී මහේසන් මහත්මිය ඉතිහාසයට එක්විය.

විද්‍යාගාරයක් සඳහා උචිත නොවන ගොඩනැගිල්ලක ගැටළු රාශියකට මුහුණ දෙමින් වර්ෂ සියයකට අධික කාලයක් කොළඹ නිදහස් චතුරශ්‍රයේ පැරණි ගොඩනැගිල්ලක පැවැති රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, 2013 වර්ෂයේදී බත්තරමුල්ල, පැලවත්තේ ඉදි කරන ලද මහල් 06ක් සහිත නව විද්‍යාගාර හා කාර්යාල සංකීර්ණයකින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී.

නවීන අංගෝපාංග වලින් සමන්විත නව විද්‍යාගාරය ස්ථාපිත කිරීම හා සමගාමීව නව තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීමට හැකිවීම, අපරාධ යුක්තිය ඉටුකිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක විශ්ලේෂණ කාර්යක්ෂම ලෙස ඉටුකිරීමට මහඟු පිටිවහලක් විය.

එසේම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීමේදී අධිකරණ විද්‍යා අංශයට අත්‍යවශ්‍යව පැවැති DNA තාක්ෂණය මෙරටෙහි ස්ථාපිත කිරීමෙහිලා ශ්‍රී ලංකා රජය හා USAID ව්‍යාපෘතිය හා එක්ව DNA විද්‍යාගාරයක් 2013 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලෙහි ආරම්භ කරන ලදී.

කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (KOICA) මඟින් ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ DNA විද්‍යාගාරය වැඩි දියුණු කිරීමත්, ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට පරිගණක අපරාධ විමර්ශණ විද්‍යාගාරයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමත්, දෙපාර්තමේන්තුව මඟින් අපරාධ යුක්තිය පසිඳලීම සඳහා සපයන විද්‍යාත්මක සාක්ෂි, තවදුරටත් සඵලදායී කිරීම සඳහා ලැබුණු සුවිශේෂී පියවරකි.

මේ අයුරින් ලබාගන්නා ලද විද්‍යාත්මක විශ්ලේෂණ වල ඉහල ගුණාත්මකභාවය තුළින් 2016 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර සඳහා ISO 17025 අන්තර්ජාතික ප්‍රතීතකරණය ලබාගත හැකි විය. වර්ෂ 1904 දී එක් නිලධාරියෙකුගෙන් ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් නිලධාරීන් 92 ක් පමණ සේවය කරන අතර 22 වන රස පරීක්ෂකවරිය ලෙස පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය පත්වී ඇති අතර 8 වන සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස කේ.කේ. අප්සරා මෙනවිය පත්විය.

මෙම දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක යටතේ ක්‍රියාත්මක වන අතර නිහඬ වූත්, අභිමානවූත් සේවයක් ශ්‍රී ලංකාව තුළ සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩ නැංවීම වෙනුවෙන් ඉටුකරනු ලබයි.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

සාධාරණ සහ නීතිගරුක සමාජයක් ගොඩ නැගීම

මෙහෙවර

අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට අධිකරණ විද්‍යා සහ ආහාර විද්‍යා ක්ෂේත්‍රයන් සම්බන්ධ විද්‍යාත්මක විශ්ලේෂණ, විශේෂඥ සහ උපදේශන සේවාවන් සැපයීම

අරමුණ

කාර්යක්ෂම සහ සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ ඇති එකම රජයේ අධිකරණ විද්‍යා විද්‍යාගාරය වේ. ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය හා ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය හා මනෝවර්තක, මස්තු විද්‍යා හා DNA, ධූලක විද්‍යා, සැකකටයුතු ලේඛන, පරිගණක ඩිජිටල් අපරාධ විමර්ශන සහ විවිධ නඩු භාණ්ඩ යනුවෙන් ප්‍රධාන අංශ අටකින් අධිකරණ විද්‍යා අංශය සමන්විත වේ. ආහාර අංශය අහාර, ජලය හා මත්පැන් යනුවෙන් රසායනාගාර තුනකින් සමන්විතය.

මෙම දෙපාර්තමේන්තුව සේවාවන් සඳහා වෙන්වූ ආයතනයක් වන අතර, අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය, වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මඟින් යොමු කරනු ලබන නඩු භාණ්ඩ හා වෙනත් ආදර්ශ හා සාම්පල් විද්‍යාත්මක පරීක්ෂණයන්ට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදුකරනු ලබයි. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ජලය ආශ්‍රිත ආදර්ශ වල තත්වය පරීක්ෂා කර වාර්තා ලබාදීම සිදු කරනු ලබයි. තවද අධිකරණ මඟින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛණ පරීක්ෂා කර වාර්තා කිරීම සැක කටයුතු ලේඛණ අංශය මඟින් සිදු කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත, ආහාර පනත, ජාතික පාරිසරික පනත, සුරාබදු ආඥා පනත, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පළිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිණිඅවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ පනත, මෝටර් වාහන පනත, බුද්ධිමය දේපල පනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.

තවද දිවයිනේ සිදුවන මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, වෙඩි තැබීම් ආදී දරුණු ගණයේ අපරාධ සහ පිපිරීම්, ගිනි ගැනීම්, මාරක රිය අනතුරු සම්බන්ධ අපරාධ ස්ථාන විමර්ශණයන් සඳහා නිලධාරීන්ගේ විශේෂඥ සහාය පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදේ. මීට අමතරව දේශීය හා විදේශීය ප්‍රභූන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ආහාර පරීක්ෂාව සිදු කරනු ලබන්නේ ධූලක විද්‍යා (වස විෂ) අංශය මඟිනි.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද රස පරීක්ෂක වාර්තා සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් අධිකරණයේදී විශේෂඥ සාක්ෂිකරුවන් ලෙස දිවයිනේ විවිධ අධිකරණ වලදී විශේෂඥ සාක්ෂි ලබාදෙනු ලැබේ.

මෙවැනි සේවා සැපයීමට අමතරව විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විශේෂඥ නිලධාරීන් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදුකරයි. විශේෂයෙන්ම ආහාර පනත යටතේ පනවනු ලබන රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සැදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලබාදෙනු ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ, පුපුරන ද්‍රව්‍ය හා වෙනත් රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම් වලදී මෙන්ම වෙනත් ආයතනවල අධි තාක්ෂණික උපකරණ මිලදී ගැනීම් වලදී තාක්ෂණික කමිටු වලට තාක්ෂණික සහාය ලබාදීමද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

තවද පොලිස් නිලධාරීන්, අපරාධ පරීක්ෂණ නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ ආධුනික නීතිඥයන්ට හා අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඔවුන්ගේ අධිකරණ විද්‍යාත්මක හා ආහාර විද්‍යාත්මක දැනුම ප්‍රවර්ධනය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් විසින් දේශන, පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අධිකරණ විද්‍යා අංශය

මෙම අංශය යටතේ පහත සඳහන් විශ්ලේෂණ රසායනාගාර පවතී.

1. ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා රසායනාගාරය

ගිනිඅවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය විසින් විවිධ වර්ගයේ ගිනි අවි එනම් රයිපල, පිස්තෝල, පතරොම්, තුවක්කු, කොටන තුවක්කු සහ පතරොම් වර්ග ලඟ තබා ගැනීමකදී, මේවා අපරාධ සඳහා යොදා ගත් බවට සැක කරන අවස්ථා වලදී ඒවා පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලබයි. ගිනි අවි භාවිතා කොට සිදු කරනු ලබන අපරාධ පිළිබඳව අන්වීක්ෂීය සැසඳුම් පරීක්ෂණ සිදුකරමින් විද්‍යාත්මකව විමර්ශණය කිරීම මීට ඇතුළත් වේ. ඒ සඳහා අපරාධ වලදී භාවිතා කරන ලද ගිනිඅවි, ගිනි අවි වල කොටස්, විවිධ පතරොම් වර්ග, වැයවූ පතරොම් කොපු හා උණ්ඩ ආදිය පරීක්ෂා කරනු ලැබේ. තවද වෙඩි තැබීම් වලට ලක්වූ මෝටර් රථ, ගොඩනැගිලි ආදියද පරීක්ෂාවට ලක්කරන අතර කුමන ගිනි අවියක් අදාල අපරාධ සඳහා භාවිතා කළේද යන්න පිළිබඳ විශේෂඥ මතයන් ඉදිරිපත් කරනු ලැබේ.

2. පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි විමර්ශන රසායනාගාරය

මෙම අංශය මඟින් බෝම්බ පිපිරීම්, පුපුරණ ද්‍රව්‍ය හා පිපිරුම් උපක්‍රම (බෝම්බ) යමෙක් තම සන්තකයේ තබා ගැනීම් ඇතුළු පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර සිදුකරන අපරාධ වලට අදාල නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සන්තකයේ තබා ගැනීමේදී අත් අඩංගුවට ගන්නා ලද විවිධ වර්ගයේ පිපිරුම් උපක්‍රම (දේශීය හා විදේශීයව) නිෂ්ක්‍රීය කිරීමෙන් පසු, ඒවායේ කොටස්ද මෙම නිලධාරීන් විසින් විශ්ලේෂණයට භාජනය කරනු ලබයි. එමෙන්ම දේපළ, ගොඩනැගිලි හා වාහන ආදිය ගිනිගැනීම් වලදී පොලීසියට කරනු ලබන පැමිණිලි හා රක්ෂණ වන්දි සඳහා කරනු ලබන ඉල්ලීම අනුව එම ගිනි ගැනීම් පිළිබඳව විමර්ශණය කර ගිනි ගැනීමට හේතුව සම්බන්ධයෙන් මතයන් ඉදිරිපත් කිරීමද මෙම අංශයේ නිලධාරීන්ගේ කාර්යයට අදාල වේ.

3. මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක රසායනාගාරය

පොලීසිය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, සුරාබදු මත්ද්‍රව්‍ය අංශය හෝ ශ්‍රී ලංකා රේගුව මඟින් අත්අඩංගුවට ගනු ලබන අන්තරාදායක ඖෂධ හා මනෝවර්තක යටතට ගැනෙන හෙරොයින්, මෝර්ෆීන්, අබිං, ගංජා සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, කොකේන්, මෙත්ඇම්පිටමීන් සහ එම කාණ්ඩයට අයත් මත්ද්‍රව්‍ය සහ New Psychoactive Substances (NPS) ගණයට වැටෙන මත්ද්‍රව්‍ය රසායනිකව හඳුනාගැනීම හා ඒවාහි ක්‍රියාකාරී සංඝටක වල සංශුද්ධතාව විශ්ලේෂණය කර අධිකරණය වෙත වාර්තා කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි. එමෙන්ම අවශ්‍ය අවස්ථාවලදී මත්ද්‍රව්‍ය රඳවාගත් ස්ථාන, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලැබීයයි සැකකරන ස්ථාන සහ මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදාගත් වාහන ආදිය පරීක්ෂා කිරීමට පොලීසියට අවශ්‍ය විශේෂඥ සහාය ලබාදේ.

4. අධිකරණ මස්තු විද්‍යා සහ ඩී.එන්.ඒ රසායනාගාරය

විවිධ දරුණු අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ලබා ගන්නා ජීව විද්‍යාත්මක ද්‍රව්‍යය මෙන්ම, ජීව විද්‍යාත්මක මව, පියා සහ දරුවන් යන මෙම පාර්ශව අතර සම්බන්ධතාවය තහවුරු කර ගැනීම සඳහා මිනිස් ශරීරයේ ශාරීරික ජෛව තරල හා දත් ඇතුළු ඕනෑම ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් අනුසාරයෙන් පරීක්ෂණ කටයුතු සිදු කර, ඩී.එන්.ඒ තාක්ෂණය ආශ්‍රයෙන් වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

එමෙන්ම සංකීර්ණ මිනීමැරුම් සහ අපරාධ ස්ථාන වල වූ රුධිර පැල්ලම්, කෙස්, ලේ විසිරීම් රටා ආදී ජීව විද්‍යාත්මක සාක්ෂි පරීක්ෂා කර, විශ්ලේෂණයෙන් අනතුරුව වාර්තා නිකුත් කිරීමද මෙම අංශයේ රාජකාරී වලට අයත් වේ.

5. අධිකරණ ධූලක විද්‍යා රසායනාගාරය

අධිකරණ ධූලක විද්‍යා අංශයේ සිටින විශේෂඥයන් විසින් අධිකරණ වෛද්‍ය කාර්යයන් හා අපරාධ විමර්ශණ සඳහා වස වර්ග හඳුනා ගැනීම පිණිස විශ්ලේෂණ කටයුතු රාශියක් සිදු කරනු ලැබේ. අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් හෝ අධිකරණය විසින් භාරදෙනු ලබන සැක සහිත සහ හදිසි මරණ වලට භාජනය වූ තැනැත්තන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණවලදී ලබාගත් ශරීර කොටස් හා ආදර්ශ, මත්ද්‍රව්‍ය සහ අනෙකුත් වස වර්ග වන සයනයිඩ්, පලිබෝධ නාශක වර්ග, විබාදක අම්ල වර්ග සහ කාබන් මොනොක්සයිඩ් වැනි අහිතකර රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණය කිරීම, බීමත්ව රිය පැදවීම සැක කරන අවස්ථාවලදී සහ මාරක රිය අනතුරුවලදී මත්පැන් හෝ වෙනත් ඖෂධ භාවිතා කර තිබේදැයි හඳුනා ගැනීම සඳහා පුද්ගලයින්ගේ රුධිරය සහ මුත්‍රා සාම්පල විශ්ලේෂණය කිරීම, අපරාධ ස්ථානයෙන් සොයාගත් අධිකරණ විද්‍යාත්මකව වැදගත් භෞතික සාක්ෂි (ඖෂධ පෙති, වස බෝතල, ඉතිරි වූ ආහාර ද්‍රව්‍ය ආදිය) ද මත්ද්‍රව්‍ය, විෂ වර්ග සහ අම්ල වර්ග හඳුනා ගැනීම සඳහා රසායනික විශ්ලේෂණ මෙම අංශය මඟින් සිදුකෙරේ.

6. අධිකරණ විද්‍යාත්මක සැකකටයුතු ලේඛන විද්‍යාගාරය

අධිකරණමය හා නීතිමය කටයුතු සඳහා අවශ්‍ය වන සැක සහිත ලිපි ලේඛන සහ ඒවා නිපදවීමට භාවිතා කරන ලද ද්‍රව්‍ය මෙම අංශය මඟින් පරීක්ෂාවන්ට ලක්කෙරේ.

සියළු වර්ග වල සැක කටයුතු ලේඛන, අත්අකුරු සහ අත්සන් ආදිය, මෙම අංශයේදී ඒවායේ නිර්ව්‍යාජභාවය සඳහා පරීක්ෂා කරනු ලැබේ. තවද අපරාධවලට මෙන්ම සිවිල් නඩු වලට අදාල ලේඛණවල තිබෙන වෙනස් කිරීම්, මැකීම්, විකෘති කිරීම්, එකතු කිරීම් සහ ආදේශ කිරීම් ආදිය හඳුනාගැනීම, ගමන් බලපත්‍ර, වීසා, ලිවීමේ උපකරණ, තීන්ත, කඩදාසි සහ අලවන ද්‍රව්‍ය, පිළිස්සුනු සහ විකෘති කරන ලද ලේඛන, ව්‍යාජ මුදල් නෝට්ටු, ලොතරැයිපත්, ආදායම් මුද්දර, තැපැල් මුද්දර සහ රජයේ ආදායමට සම්බන්ධ වෙනත් යම් ලේඛන පරීක්ෂා කර ඒවායේ නිර්ව්‍යාජ බව හෝ අදාල වෙනත් නිගමනයන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ඉදිරිපත් කිරීම මෙම අංශයේ විශේෂඥ නිලධාරීන්ගේ කාර්යභාරය වේ.

7. පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය

මෑතකදී ස්ථාපිත කර ඇති ඩිජිටල් අපරාධ විශ්ලේෂණ අංශය මූලික ලෙස ඩිජිටල් දත්ත විශ්ලේෂණය, ඩිජිටල් ඡායාරූප විශ්ලේෂණය, කටහඬ හා ශබ්ද විශ්ලේෂණය හා ජීවමිතික ලක්ෂණ විශ්ලේෂණය යන මූලික අංශ 4ක් යටතේ විශ්ලේෂණ කටයුතු සිදුකරනු ලබයි.

පරිගණක, ජංගම දුරකථන, CCTV DVR යන්ත්‍ර ආදී ඩිජිටල් උපාංග තුළ අන්තර්ගත දත්ත විශ්ලේෂණය හා ඒවායේ මකා දමා ඇති දත්ත ප්‍රතිඋත්පාදනය, CCTV වීඩියෝ දත්ත විශ්ලේෂණය, ජීවමිතික ලක්ෂණ ඇසුරින් CCTV දර්ශණ වල හා ඩිජිටල් උපකරණ වල දර්ශනය වන පුද්ගලයින්ගේ මුහුණු හඳුනා ගැනීම, CCTV දර්ශන වල ඇතුළත් අපැහැදිලි වාහන ලියාපදිංචි අංක තහඩු හඳුනා ගැනීම, ඩිජිටල් ඡායාරූප හා වීඩියෝ පට වැඩි දියුණු කිරීම විශ්ලේෂණය හා වෙනස් කිරීම් වලට ලක්කර ඇතිද යන්න හඳුනා ගැනීම සහ කටහඬ විශ්ලේෂණය මගින් පටිගත කරන ලද සංවාදයන්හි මිනිස් කටහඬෙහි අනන්‍යතාවය තහවුරු කිරීම ආදී විශ්ලේෂණ මෙහිදී සිදු කරයි.

8. විවිධ නඩු භාණ්ඩ විශ්ලේෂණ විද්‍යාගාරය

විවිධ නඩු භාණ්ඩ අංශයේ සිටින අධිකරණ විද්‍යා විශේෂඥයින් විසින් අනිකුත් විෂයයන් යටතේ නිශ්චිතව වර්ගීකරණය කිරීමට නොහැකි අනන්‍යාකාර වූ භෞතික සාක්ෂි පරීක්ෂාවට භාජන කරනු ලැබේ. සැක කටයුතු වාහන වල චැසි අංක සහ එන්ජින් අංක පරීක්ෂා කිරීම සහ ඒවා සත්‍යද, වංචනිකද, යන්න නිගමනය කිරීම හා බද්ධ කරන ලද වාහන හඳුනා ගැනීම එක් උදාහරණකි. තවද අපරාධ වලට සම්බන්ධ විවිධ වර්ගයේ ස්පර්ශ සාක්ෂි හා භෞතික සාක්ෂි උදාහරණ වීදුරු කැබලි, තීන්ත පතුරු, කෙදි වර්ග, පස්, ආයුධ, ආයුධ සලකුණු (ඇඟිලි සලකුණු හැර), ලාංඡන ආදිය සඳහා විද්‍යාත්මක පරීක්ෂණ හා විවිධ තාක්ෂණික උපකරණ භාවිතා කරමින් කරනු ලබන පරීක්ෂණ මෙන්ම රසායනික විශ්ලේෂණ ක්‍රම මගින් හඳුනා ගැනීම සහ සංසන්දනය මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. මීට අමතරව වාහන අනතුරු වලට අදාල වන වාහන අනතුරු වූ ස්ථාන සහ අදාල අනෙකුත් සාක්ෂි විද්‍යාත්මකව පරීක්ෂා කර එම අනතුරු ප්‍රති නිර්මාණය කර අවශ්‍ය වැදගත් සාක්ෂි සොයා ගැනීම මෙම අංශයේ විශේෂඥයින්ගේ වගකීමකි.

ආහාර විද්‍යා අංශය

1. ආහාර හා ජලය විශ්ලේෂණ රසායනාගාරය

1980 අංක 26 දරන ආහාර පනත යටතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ආහාර පරීක්ෂකවරුන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්) විසින් ඉදිරිපත් කරනු ලබන ආහාර සාම්පල, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන, විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ආහාර පාලන ඒකකය, අනෙකුත් රජයේ ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන එවැනි ආහාර සාම්පල විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම හා රේගු දෙපාර්තමේන්තුව, පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආදී ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ජාතික පාරිසරික පනත යටතේ ආණ්ඩුවේ විවිධ ආයතන සහ සංස්ථා සඳහා කර්මාන්ත අප ජලය විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම අහාර පනත යටතේ බෝතල් කරන ලද ජලය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති රෙගුලාසි යටතේ පානීය ජලය සඳහා විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

2. මද්‍යසාර විශ්ලේෂණ රසායනාගාරය

අධිකරණය මගින් විශ්ලේෂණය සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන නීති විරෝධී මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදන විශ්ලේෂණය කර සුරා බදු ආඥා පනත යටතේ අධිකරණය වෙත වාර්තා නිකුත් කිරීම සහ සුරාබදු දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබන දේශීය සහ විදේශීය මත්පැන් සඳහා තත්ත්ව වාර්තා නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වන කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීම සඳහා අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය වන අරමුදල් රැස්කිරීම සහ ඒවා කාර්යක්ෂමව, ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් මෙහෙයවීම තුළින් මූල්‍ය කළමනාකරණය කිරීම හා ඊට සම්බන්ධ ගිණුම් කටයුතු පවත්වාගෙන යාමද, මූල්‍ය තොරතුරු අවශ්‍ය වෙනත් පාර්ශවයන් වෙත ලබාදීමද මූල්‍ය අංශයේ වගකීම වේ.

එම කටයුතු කර ගෙන යාමේදී,

- කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය උපදෙස් හා මග පෙන්වීම
- ආයතනය සතු වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- රාජ්‍ය මුදල් රෙගුලාසි හා චක්‍ර ලේඛ විධි විධාන වලට අනුකූලව මූල්‍ය පරිහරණය කිරීම
- ගිණුම්කරණය හා වාර්තා කිරීම යනාදී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

ආයතන අංශය

දෙපාර්තමේන්තුව තුල ප්‍රශස්ත කාර්යමණ්ඩලයක් පවත්වා ගනිමින් හා විධිමත් මානව සම්පත් කළමනාකරණය තුලින් කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම සහ සම්බන්ධීකරණය මෙම අංශය මගින් සිදුකරනු ලැබේ. ඒ යටතේ,

- කාර්යමණ්ඩල බඳවා ගැනීම්, පුහුණු කිරීම , ධාරිතා සංවර්ධනය, උසස් කිරීම හා විශ්‍රාම ගැන්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය තුල ඇති දීපව්‍යාප්ත සේවාවන්වල හා ඒකාබද්ධ සේවාවන්වල නිලධාරීන්ගේ පරිපාලන කටයුතු රේඛීය අමාත්‍යාංශය වන අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන පලාත් සභා හා පලාත්පාලන කටයුතු අමාත්‍යාංශය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග සම්බන්ධවෙමින් සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ අංශ අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමටත් එම අංශවල කටයුතු ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් හා වෙනත් සම්පත් සම්පාදනය කිරීම.
- ආයතනයේ සියළු නඩත්තු කටයුතු අදාල පරිදි ගිවිසුම් ගත වෙමින් ඉටුකිරීම.
- ආයතනයේ දෛනික ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම.

1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතියේ විස්තර

ව්‍යාපෘතියේ නම	ප්‍රදානය කරන රට	ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල	ව්‍යාපෘතියේ කාලය
1. ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ අධිකරණ විද්‍යා ඖෂධ විශ්ලේෂණයේ ධාරිතා ගොඩ නැගීම ශක්තිමත් කිරීම.	කොරියාව (KOICA Project)	ඇ. ඩො. මි. 4.5	2022-2025
• JURE ව්‍යාපෘතිය - Support to Justice Sector Project	European Union (EU) Joint with UNDP	ඇ. ඩො. මි. 1.4	2023 - 2025

02 පරිච්ඡේදය

කාර්ය සාධනය සහ අනාගත අභියෝග

විශ්ලේෂණ වාර්තා වල ප්‍රගතිය

වර්ෂයක් තුළ නිකුත් කරනු ලබන විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධනය මැන බැලීමේ ප්‍රධාන දර්ශකය වේ. 2023 වර්ෂයේ ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව 58,886 ක් වන අතර 2024 වර්ෂයේදී ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව 64,524 ක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව එය 10% දක්වා වර්ධනයකි. තවද 2024 වර්ෂය තුළ නිකුත් කළ විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව 52,126ක් වූ අතර 2023 වසරේ නිකුත් කළ විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව 53,253කි. එය 2023 වර්ෂයට සාපේක්ෂව 02%ක අඩු වීමකි.

	2023	2024
ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව	58,886	64,524
වාර්තා කල නඩු භාණ්ඩ සංඛ්‍යාව	53,253	52,126

ඒ ඒ අංශවල කාර්යසාධනය :-

අංශය	විද්‍යාගාරය	2024.01.01 දිනට නඩු සංඛ්‍යාව	ලැබුණු නඩු සංඛ්‍යාව	වාර්තා කල නඩු සංඛ්‍යාව	2024.12.31 දිනට වාර්තා නොකල නඩු සංඛ්‍යාව
අධිකරණ විද්‍යා ක්ෂේත්‍රය	මත්ද්‍රව්‍ය හා මනෝවර්තක	9,754	35,044	27,127	17,671
	ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා	315	557	301	571
	පුපුරණ ද්‍රව්‍ය හා ගිනි ගැනීම්	125	608	381	352
	අධිකරණ ධූලක විද්‍යා (වස වර්ග)	1,139	2,903	1,819	2,223
	අධිකරණ මස්තු විද්‍යා	3,221	2,172	1,393	4,000
	සැක කටයුතු ලේඛණ	172	812	726	258
	ඩිජිටල් අපරාධ	1,157	1,143	833	1,467
	විවිධ අධිකරණ ද්‍රව්‍ය	354	933	866	421
එකතුව		16,237	44,172	33,446	26,963
ආහාර විද්‍යා ක්ෂේත්‍රය	මත්පැන්	1,453	11,599	9,824	3,228
	මධ්‍යසාර හා දුම්කොළ	92	3,210	3,302	-
	ආහාර පනත යටතේ ආහාර සාම්පල	30	4,016	4,024	22
	විවිධ ආහාර වර්ග	10	1,527	1,530	7
එකතුව		1,585	20,352	18,680	3,257
මුළු එකතුව		17,822	64,524	52,126	30,220

සමස්තයක් ලෙස ගත් කල වැඩිම නඩු සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශයට වන අතර ඊට අනුව වැඩිම වාර්තා ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ ද එම අංශයෙනි.

විශ්ලේෂණ කටයුතු වලට අමතරව සිදුකරනු ලැබූ කාර්යයන්

කාර්යය	සංඛ්‍යාව
අධිකරණ වලදී සාක්ෂි සැපයූ අවස්ථා	දින 279
අපරාධ ස්ථාන වලට සහභාගී වූ අවස්ථා	දින 475
නිවාඩු දින දීමනා හා අතිකාල දීමනා	දින 779 සහ පැය 397.2
ධූලක විද්‍යා අංශයේ නිලධාරීන් සහභාගී වූ විශේෂ ප්‍රභූ සහ රාජ්‍ය තාන්ත්‍රික ආහාර පරීක්ෂණ	නිලධාරි දින 23
දේශන පැවැත්වීම	දින 33
දේශීය පුහුණු	නිලධාරි දින 526
විදේශීය පුහුණු	නිලධාරි දින 188
විදේශීය සම්මන්ත්‍රණ	02
පශ්චාත් උපාධිය සඳහා විදේශ ගත නිලධාරීන් (එක්සත් රාජධානිය)	02
පශ්චාත් උපාධිය සඳහා විදේශ ගත නිලධාරීන් (කොරියාව)	08


Statistics for All Sections - (2020 to 2024)
70,000
60,000
50,000
40,000
30,000
20,000
10,000
-
35,191
34,689
14,673
29,273
36,328
7,700
45,245
40,756
12,189
58,886
53,253
17,822
64,524
52,126
30,220
2020
2021
2022
2023
2024
Received
Reported
Backlog


Statistics for the Narcotic Section (2020 to 2024)
40,000
35,000
30,000
25,000
20,000
15,000
10,000
5,000
-
17,983
16,928
5,873
13,358
17,841
1,390
20,798
16,479
5,709
28,133
24,088
9,754
35,044
27,127
17,671
2020
2021
2022
2023
2024
Received
Reported
Backlog


Monthly Statistics for the All Sections - 2024
35,000
30,000
25,000
20,000
15,000
10,000
5,000
-
5,798 5,542 18,078
6,099 5,792 18,385
5,448 4,682 19,151
4,633 3,052 20,732
5,149 3,942 21,939
4,871 4,157 22,653
6,083 3,884 24,852
5,532 3,691 26,693
4,380 4,754 26,319
6,199 3,685 28,833
5,593 4,383 30,043
4,739 4,562 30,220
January
February
March
April
May
June
July
August
Septem…
October
November
December
Received
Reported
Backlog


Monthly Statistics for the Narcotic Section - 2024
20,000
18,000
16,000
14,000
12,000
10,000
8,000
6,000
4,000
2,000
-
4,028 3,545 10,237
3,176 3,585 9,828
2,763 2,636 9,955
2,787 1,765 10,977
2,827 2,111 11,693
2,682 2,297 12,078
3,330 1,552 13,856
3,058 1,408 15,506
2,352 2,345 15,513
3,052 1,469 17,096
2,677 1,840 17,933
2,312 2,574 17,671
January
February
March
April
May
June
July
August
September
October
November
December
Received
Reported
Backlog

1. විශ්ලේෂණය අවසන් කර ගත නොහැකි වූ නඩු භාණ්ඩ ප්‍රමාණය අඩු කිරිම

වාර්තා කිරිම සඳහා ඉදිරිපත් කරනු ලබන නඩු භාණ්ඩ පිළිබඳ වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පුරප්පාඩු පිරවීම අත්‍යාවශ්‍ය වේ. 2024.12.31 වන විට සහකාර රස පරීක්ෂක නිලධාරීන් 21 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී ඇති අතර බඳවා ගැනීමට ඉල්ලුම් කර ඇත. තවද දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරු කිහිපයකට අදාලව 121ක් වූ කාර්යමණ්ඩලයක් පුරප්පාඩු වී ඇති අතර එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා සෘජුවම බලපාන බව පෙන්වා දෙමි. තවද නඩු භාණ්ඩ ලැබීම 2024 වර්ෂය තුළදී 2023 වර්ෂයට සාපේක්ෂව 10% ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති අතර පවතින අධික පුරප්පාඩු තත්වය තුළදී විශ්ලේෂණය අවසන් කර නඩු වාර්තා ඉදිරිපත් කිරිම 2023 වර්ෂයට සාපේක්ෂව 02% ක ප්‍රමාණයකින් පමණ පහළ ගොස් ඇත.

දෛනිකව ඉදිරිපත් වන නඩු භාණ්ඩ මෙන්ම ඉහත පරිදි විශ්ලේෂණය අවසන් කිරීමට නොහැකි වූ නඩු සම්බන්ධ කටයුතු නිම කිරීම සඳහා නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම අවශ්‍ය වන අතර සතියේ දිනවල අතිරේක පැය කිහිපයක් සේවය කිරීම මෙන්ම රජයේ නිවාඩු දින වල සේවයේ යෙදවීමටද සිදුවිය.

2. පර්යේෂණ හා සංවර්ධන අංශයක් ස්ථාපිත කිරීම

නවීනතම විද්‍යාත්මක ක්‍රමවේදයන් පිළිබඳ දැනුම දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ඉතා වැදගත් වේ. නව මත්ද්‍රව්‍යයන් හා රසායනිකයන් භාවිතයට එකතුවීම දිනපතා සිදුවන අතර දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම තත්ත්වයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් සහිත වීම අවශ්‍ය වේ. මේ සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට දේශීය මෙන්ම විදේශීය පුහුණු හා පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා ලබාදීම සිදුකල යුතුය.

3. අධිකරණ වලින් ඉදිරිපත් කරන ලද සාම්පල ඉවත් කිරීම

රටේ ක්‍රියාත්මක වන අධිකරණ ක්‍රමය තුළදී යම් නඩුවක් සඳහා අවසන් තීරණයක් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් පරීක්ෂණ අවසන් කරන ලද නඩු භාණ්ඩ ඉවත් කර ගැනීම ප්‍රමාද වේ. නඩු භාණ්ඩ ලැබීම අධිකවීම නිසා ඒවා ගබඩා කර තැබීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිකම දැඩි ගැටළුවකි. මේ හේතුවෙන් වාර්තා ඉදිරිපත් කල නඩු භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් කාලානුරූපීව ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කල යුතුව ඇත. මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමා සමග සාකච්ඡාවක් පවත්වා නඩු භාණ්ඩ ඉවත්කිරීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලීමක් කර ඇත. මේ වන විට පොලිස් නිලධාරීන් අධිකරණ නියෝගයන් අනුව නඩුභාණ්ඩ ඉවත් කිරීම සිදුකරනු ලබයි. 2024 වර්ෂයේ දී පමණක් මත්ද්‍රව්‍ය හා මනෝවර්ථක අංශයට අයත් නඩු භාණ්ඩ 15,000 ප්‍රමාණයක් ඉවත් කර ගෙන ඇත.

විශ්ලේෂණය අවසන් වූ නඩු භාණ්ඩ සම්බන්ධ ලේඛණ විශාල ප්‍රමාණයක් එක්රැස් වී පවතින අතර එම ලේඛණ ගබඩා කිරීම සඳහා මේ වන විට පවතින ඉඩ ප්‍රමාණවත් නොවේ. අධිකරණවල නඩු කටයුතු අවසන් වූ නඩු පිළිබඳ තොරතුරු රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා ගත හැකිනම් එක් රැස් වී ඇති අනවශ්‍ය ලේඛණ විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවෙන් ඉවත් කර නව ලේඛණ ගබඩා කිරීමට ඉඩ පහසුකම් යොදාගත හැක.

4. වීඩියෝ තාක්ෂණ ඔස්සේ විශේෂඥ සාක්ෂි ලබාදීම.

දිවයින පුරා පිහිටා ඇති අධිකරණ වල සාක්ෂි ලබාදීම සඳහා නිලධාරීන් සහභාගී කරවීමේදී මතුවන ගැටළු අවම කර ගැනීම සඳහා මාර්ගගත වීඩියෝ තාක්ෂණය මගින් කඩිනමින් සාක්ෂි ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම ඉතාමත් වැදගත් වේ. මෙහි මූලික පියවරක් ලෙස වීඩියෝ තාක්ෂණ උපකරණ කට්ටල දෙකක් අධිකරණ අමාත්‍යාංශය හා UNDP ව්‍යාපෘතිය මගින් අප දෙපාර්තමේන්තුවට ලබාදුන් අතර ඒවා දැනටමත් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇත.



මෙම ක්‍රමය යටතේ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට රට පුරා පැතුරුණු විවිධ අධිකරණ වලට තම විශේෂඥ සාක්ෂි ලබාදීම කළ හැකිනම් භෞතිකව සහභාගීවීමට ගත වන කාලය විශාල වශයෙන් ඉතිරි වන නිසා කාලය වඩාත් ඵලදායීව රාජකාරී කටයුතු සඳහා යෙදවීමට හැකිවීම මෙන්ම රජයේ වියදම්ද සාපේක්ෂව අවම කර ගත හැකි බව පෙනේ.

5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

දිනෙන් දින වර්ධනය වන නඩු භාණ්ඩ ලැබීම කළමනාකරණය කර ගත හැකි පරිදි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ඵලදායීතාවය වර්ධනය කිරීම කෙරෙහි බලපානු ලබයි. ICTA ආයතනය මඟින් අදියර දෙකකින් යුත් ව්‍යාපෘතියක් ලෙස මෙම මෙහෙයුම් මෘදුකාංගයන් ලබාදීමට බලාපොරොත්තු වන අතර 2024 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය නියමු මට්ටමින් ආරම්භ කරන ලදි.

6. පරීක්ෂණාගාර වල විශ්ලේෂණ කටයුතු කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීම

ඉදිරිපත් වන සාම්පල හා රසායනාගාර වල තොරතුරු ඵලදායීව හැසිරවිය හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මේ යටතේ අපේක්ෂා කෙරේ.

7. යටිතල පහසුකම් සංවර්ධනය

UNDP ආයතනය සමඟ Support To Justice Sector Project (JURE) නමින් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ පූර්ණ එකඟතාවය මත ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතිය 2025 වර්ෂය තෙක් ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ අතර, එම ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස දෙපාර්තමේන්තුවේ එක්රැස් වී ඇති විශාල නඩු භාණ්ඩ ප්‍රමාණයක් විශ්ලේෂණය කර අවසන් කිරීමේ අරමුණ ඇතිව විද්‍යාත්මක නිලධාරීන් 15 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට මූල්‍යමය ආයකත්වය ලබා දෙන ලදී. ඒ අනුව එම නිලධාරීන් 15 දෙනා අතරින් මත්ද්‍රව්‍ය හා මනෝවර්තක රසායනාගාරයට නිලධාරීන් 06 දෙනෙකු, අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්.ඒ. රසායනාගාරයට නිලධාරීන් 04 දෙනෙකු , අධිකරණ ධූලක විද්‍යා රසායනාගාරයට නිලධාරීන් 03 දෙනෙකු හා පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරයට නිලධාරීන් 02කු ලෙස අනුයුක්ත කරන ලදී. එම නිලධාරීන් අනුයුක්ත කිරීමෙන් පසු 2024 වර්ෂයේදී අධිකරණ ධූලක විද්‍යා රසායනාගාරයේ එම නිලධාරීන් මඟින් නඩු භාණ්ඩ 104 ප්‍රමාණයක් විශ්ලේෂණය කළ අතර, මත් ද්‍රව්‍ය හා මනෝවර්තක රසායනාගාරයේ 3480 පමණ නඩු භාණ්ඩ ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබී ඇත. තවද අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්.ඒ. විද්‍යාගාරය නඩු භාණ්ඩ 627 විශ්ලේෂණය කිරීමට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට සහාය දක්වා ඇත. තවද පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරයේ නඩු භාණ්ඩ 87 ක් විශ්ලේෂණය කරන ලදි.

2024 වර්ෂය තුළදී JURE ව්‍යාපෘතිය මගින් රු. 15,309,961.44 වටිනා මූල්‍ය දායකත්වයක් විදේශ ප්‍රදාන යටතේ ලබා දෙන ලදි. ඒ මගින් කොන්ත්‍රාත් පදනම මත ලබා ගන්නා ලද විද්‍යාත්මක නිලධාරීන්ගේ වැටුප් සහ විද්‍යාගාර සඳහා මෘදුකාංග ලබා ගැනීම ප්‍රතීතකරණ කටයුතු සඳහා වන වියදම් දැරීම සිදු කර ගන්නා ලදි. කෙසේ වුවද 2024 වර්ධයේ සැප්තැම්බර් මස 30 වන දින සිට පුනරාවර්ථන ස්වභාවයේ වියදම් සඳහා

මූල්‍යමය දායකත්වය ලබා නොදීමට තීරණය කිරීම මත මේ යටතේ වන සහාය අත්හිටුවීමට UNDP විසින් කටයුතු කරන ලදි.

තවද KOICA ව්‍යාපෘතිය යටතේ අපරාධ යුක්තියේදී අධිකරණ වෛද්‍ය විශලේෂණ කටයුතු සිදු කිරීමේ ධාරිතා වර්ධනය ශක්තිමත් කිරීම අරමුණු කොට ගෙන 2023-2025 කාලපරිච්ඡේදය සඳහා ඩොලර් මිලියන 4.5ක වටිනාකමින් යුතු විදේශ ප්‍රදානයක් යටතේ දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදි. මෙය යටතේ මත්ද්‍රව්‍ය විද්‍යාගාරය සහ ධූලක විද්‍යා විද්‍යාගාරය සඳහා රු. 50,546,868.00ක වටිනාකමින් යුතු විද්‍යාගාර නවීකරණ කටයුතු සිදු වූ අතර රු. 329,226,889.00ක් වටිනා විද්‍යාගාර උපකරණ ප්‍රදානය කරන ලදි. තවද රු. 85,768,242.00ක් වටිනා විද්‍යාගාර ගෘහ භාණ්ඩ, පරිගණක හා Sever පද්ධතියක් එකතු විය. තවද රු. 68,684,474.00ක් වටිනා රසායනික ද්‍රව්‍ය, රසායනික ප්‍රමිත හා පාරිභෝජන ද්‍රව්‍ය ද මෙම ප්‍රදානයට ඇතුළත් විය. ඒ අනුව මෙම ව්‍යාපෘතියට අදාලව දෙපාර්තමේන්තුව වෙත ලැබුණු විද්‍යාගාර උපකරණ කීපයක ඡායාරූප හා සංශිප්ත විස්තරයක් පහතින් ඇතුළත්ව ඇත.

<u>2024 වර්ෂයේදී ප්‍රදානයන් ලෙස ලැබුණු උපකරණ</u>

අධිකරණ ධූලක විද්‍යා අංශය

KOICA ව්‍යාපෘතිය මඟින් අධිකරණ ධූලක විද්‍යාගාරය පුළුල් කිරීම, නව උපාංග සහ උපකරණ ප්‍රදානය සිදු කරන ලදී. විද්‍යාගාරය පුළුල් කිරීම යටතේ අවශ්‍ය විදුලි සැපයීම, උපකරණ ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය ගෑස් නල පද්ධතිය, විද්‍යාගාර මේස සහ පුටු යනාදී සියලුම දේ ලබා දෙන ලදී.

Solid Phase Micro Extraction – Gas Chromatography Mass Spectrometer (SPME –GC/MS)

KOICA ව්‍යාපෘතිය යටතේ අධිකරණ ධූලක විද්‍යාගාරයේ විශ්ලේෂණ කටයුතු පහසු කරගැනීම සඳහා අවශ්‍ය වන නවීන Fiber තාක්ෂණය භාවිතා කරමින් ක්‍රියා කරන Solid Phase Micro Extraction (SPME) Gas chromatography Mass Spectrometer (GC/MS) යන්ත්‍රය ප්‍රදානයක් ලෙස ලැබුණි. මෙම තාක්ෂණය භාවිතා කරමින් රුධිරය සහ මුත්‍රා සාම්පල වල කුඩා අනුක ස්කන්ධයන් සහිත මත්ද්‍රව්‍ය (උදා- අයිස්, methamphetamine, MDMA, Ketamine) හඳුනාගැනීම සඳහා භාවිතා කරයි. තවද SPME තාක්ෂණයට අමතරව මෙම උපකරණය භාවිතා කරමින් ද්‍රව සහ වායු ආකාර දෙකටම සාම්පල වල ඇති වස වර්ග සහ ඖෂධ වර්ග විශ්ලේෂනය කිරීමට භාවිතා කරනු ලැබේ.

Automated Solid Phase Extractor – (SPE)

KOICA ව්‍යාපෘතිය යටතේ ලැබුණ Solid Phase Extractor උපකරණය මඟින් ස්වයංක්‍රීයව රුධිරය සහ මුත්‍රා සාම්පල වල අඩංගු ඖෂධ සහ වස වර්ග පරීක්ෂා කිරීමේදි ඒවා අධිතාක්ෂණික උපකරණ වලට යොමු කිරීමට ප්‍රථමව සිදු කරනු ලබන සාම්පල සැකසීමේ ක්‍රියාවලියේ ස්වයංක්‍රීය නිස්සාරණය (Automated extraction) සඳහා භාවිතා කරනු ලැබේ. ස්වයංක්‍රීයව මෙම උපකරණ ක්‍රියා කරන බැවින් මිනිස් ශ්‍රමය අවමව විශාල සාම්පල ප්‍රමාණයක් එකවර සකසා ගැනීම සිදු කළ හැකිය.



Nitrogen Evaporator

KOICA ව්‍යාපෘතිය යටතේ Nitrogen Evaporator උපකරණය ලැබුණ අතර gas chromatography හා liquid chromatography යන ක්‍රමද භාවිතා කරමින් සාම්පල විශ්ලේෂණ කටයුතු සිදු කිරීමේදී එම සාම්පල වල සාන්ද්‍රණය වැඩි කිරීමට සහ වියළි තත්ත්වයට පත් කිරීමට Nitrogen Evaporator උපකරනය භාවිතා කරයි. මෙහිදී නයිට්‍රජන් වායු ධාරාවක් සාම්පලය හරහා යැවීම මඟින් සාන්ද්‍රණය වැඩි සාම්පලයක් ලබා දේ. ජෛව සාම්පල විශ්ලේෂණයේදී මෙම ක්‍රමවේදය වඩා උපකාරී වේ.

Headspace – Gas Chromatography

තවද මෙම ව්‍යාපෘතිය යටතේ Headspace – Gas Chromatography උපකරණය ප්‍රදානයක් ලෙස ලැබුණි. මෙම උපකරණය මඟින් රුධිරය සහ මුත්‍රා සාම්පල වල මධ්‍යසාර වර්ග (උදා :- එතනෝල්, මෙතනෝල්) ප්‍රමාණාත්මකව හඳුනා ගැනීම සිදු කරනු ලැබේ.

Cobas Chemistry Analyzer

KOICA ව්‍යාපෘතිය යටතේ අධිකරණ ධූලක විද්‍යා අංශයට ලැබුණු තවත් උපකරණයකි. මෙම උපකරණය භාවිතා කර මුත්‍රා සාම්පල වල මත්ද්‍රව්‍ය තිබේද නැද්ද යන්න හඳුනා ගැනීමේ මූලික පරීක්ෂණය සිදු කරනු ලැබේ.

Biosafety Cabinet

අධිකරණ ධූලක විද්‍යාගාරය වෙත විශ්ලේෂණය සඳහා යොමු කරනු ලබන සාම්පල වල ජීව විද්‍යාත්මක උපද්‍රව (Bio Hazard) වලින් සේවක නිලධාරීන් ආරක්ෂා වී විශ්ලේෂණ කටයුතු සිදු කිරීම සඳහා භාවිතා කිරීමට KOICA ව්‍යාපෘතිය යටතේ ලැබුණු තවත් උපාංගයකි.

Freezer and Refrigerator

KOICA ව්‍යාපෘතිය යටතේ අධිකරණ ධූලක විද්‍යාගාරයේ විශ්ලේෂණ කටයුතු සඳහා භාවිතා කරන අත්‍යවශ්‍ය රසායනික ද්‍රව්‍ය සහ සාම්පල නියමිත උෂ්ණත්ව තත්ව (-20 °C සහ 4 °C) යටතේ ගබඩා කර තබා ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ අධි ශීතකරණ තුනක් සහ ශීතකරණ හතරක් ලැබුණි.

<u>වැඩිදියුණු කළ රසායනාගාරය.</u>

දැනට මත්ද්‍රව්‍ය අංශයට වෙන්ව ඇති ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින්, KOICA ව්‍යාපෘතියේ නොමසුරු ආධාර මත, පෙර පුස්තකාල පරිශ්‍රය සඳහා වෙන්ව තිබූ ඉඩ ප්‍රමාණයෙන් කොටසක අමතර රසායනාගාරයක් (Instrument Laboratory) ස්ථාපිත කරන ලදී. රුපියල් 50,546,868.00ක වියදමින් ඉදිකරන ලෙස මෙම රසායනාගාරය නවීන රසායනාගාර පහසුකම් වලින් යුක්තයි.

<u>Liquid Chromatography – Tandem Mass Spectrometry (LC – MS/MS</u>

මෙම උපකරණය, නීති විරෝධී මාධක සහ මනෝවර්තක මත්ද්‍රව්‍ය හඳුනා ගැනිමට සහ තහවුරු කිරිමට භාවිතා වන, නිරවද්‍ය, නවීන, දියුණු තාක්ෂණික ක්‍රමවේදයකි. New Psychoactive Substances (NPS) විශ්ලේෂණය සඳහා විශේෂයෙන්ම උපකාරී වේ. LC – MS/MS උපකරණය සමඟම නිලධාරීන් සිවු දෙනෙකුට එහි තාක්ෂණය හා භාවිතය පිළිබඳ විශේෂ පුහුණුවද ලබා දෙන ලදී.



UV-Vis Spectrophotometer

මෙම උපකරණය, United Nations Office on Drugs & Crime (UNODC) මඟින් මත්ද්‍රව්‍ය අංශයෙහි විශ්ලේෂණ ධාරිතාව දියුණු කිරීම උදෙසා ලබාදෙන ලද පරිත්‍යාගයකි. මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක වල ගුණාත්මක සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණය සඳහා මෙම උපකරණය භාවිතා වේ.

<u>2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවට විශ්ලේෂණය සඳහා ලැබුණු නඩු භාණ්ඩ අතුරින් සුවිශේෂ සිද්ධීන්.</u>

<u>ආහාර අංශය</u>

පසුගිය වසර තුල ආහාර රසායනාගාරයේ සිදු කළ විශ්ලේෂණ කටයුතුවලදී ප්‍රදානයන් ලෙස මෙරටට ලැබී තිබූ සහල් සහ පරිප්පු සාම්පල මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසුද යන්න පරීක්ෂා කිරිමට එක් මාසයක් වැනි කාලයක් තුල සහල් සාම්පල 715ක් හා පරිප්පු සාම්පල 337ක ප්‍රමාණයක් විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදි.

<u>මත්ද්‍රව්‍ය අංශය</u>

2024 වර්ෂයේදී මත්ද්‍රව්‍ය අංශයට නඩුභාණ්ඩ 35044 ක් ලැබුණු අතර, එය මෙතෙක් මත්ද්‍රව්‍ය අංශයට ලැබුණු වැඩිම නඩුභාණ්ඩ ප්‍රමාණය වේ. මේ අතර කිලෝග්‍රෑම් 100-400 අතර බර ප්‍රමාණ වලින් යුතු හෙරෝයින් සහ මෙත් ඇම්ෆිටමින් වලට අදාල නඩු භාණ්ඩ 06ක් මත්ද්‍රව්‍ය අංශය මගින් භාරගෙන විශ්ලේෂණ සිදු කරන ලදී.

මාලඹේ ප්‍රදේශයේ නිවසක පුද්ගලයින් හදිසියේ රෝගී වීමෙන් මිය යාම පිළිබඳ පරීක්ෂණ කටයුතු සිදුකිරීමේදී, එම ස්ථානය නීති විරෝධි ලෙස මෙත්ඇම්පිටමීන් නිෂ්පාදනය කරන ලද ස්ථානයක් බව රජයේ රස පරීක්ෂකගේ විශ්ලේෂණ තුලින් තහවුරු විය.

එමෙන්ම යාපනය දිස්ත්‍රික්කයේ තාවඩි ප්‍රදේශයේද , නීති විරෝධිව මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ස්ථානයක් පරීක්ෂා කර, එම ස්ථානය නීතිවිරෝධී මෙත් ඇම්පිටමීන් නිෂ්පාදනය සිදු කරන බව තහවුරු කරන ලදී.

ආනයන කරන ලද සකස් කළ, සැක කටයුතු අහාර ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය අංශය වෙත ඉදිරිපත් කරන ලදුව, ගංජා ශාකයේ කොටස් එම ආහාර වලට මිශ්‍ර කර නිෂ්පාදනය කර ඇති බව (Hemp flour mixed pasta) සහ (Hemp mixed candy) ගංජා ශාඛය ආශ්‍රිතව නිෂ්පාදනය කර ඇති බව (Hemp Oil) විශ්ලේෂණ වලින් හඳුනා ගන්නා ලදී. මෙසේ ගංජා ශාඛයේ කොටස් අඩංගු කර නිපදවන ලද ආහාර ද්‍රව්‍ය 2024 මුල් වරට මත්ද්‍රව්‍ය රසායනාගාරයේදී හඳුනා ගන්නා ලදී.

එසේම විශ්ලේෂණය කර අවසන් නඩු භාණ්ඩ, පුත්තලම ප්‍රදේශයේදී විශේෂයෙන් ඉදිකරන ලද දහන තාපකයක් මගින් විනාශ කරන අවස්ථාවලදී, මත්ද්‍රව්‍ය අංශයේ නිලධාරීන් විසින් ඒ සඳහා විශේෂඥ සහාය ලබා දෙන ලදි.

<u>සැකකටයුතු ලේඛන අංශය</u>

2024 වර්ෂයේදී සැකකටයුතු ලේඛන අංශය වෙත විශ්ලේෂණයට ලැබුණු නඩු භාණ්ඩ 2000කට ආසන්න ප්‍රමාණය අතර රටෙහි මහත් ආන්දෝලනයට ලක් වූ සිද්ධි රාශියක්ද විය.

1. 2024 වසරෙහි පැවැත් වූ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රශ්නපත්‍රයෙහි සමහර ප්‍රශ්න පිට කිරීමට සම්බන්ධ පුද්ගලයන්ගේ අත්අකුරු පරීක්ෂණය
2. මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයේ දැනට විභාගවන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉමියුනොග්ලොබියුලින් නඩුව (immunoglobulin case) සඳහා එම අමාත්‍යාංශයේ මෙම අපරාධයට සම්බන්ධ ලේඛනවල වූ නිළධාරින්ගේ අත්සන් හා අත්අකුරුවල අනන්‍යතාව තහවුරු කිරීම.
3. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තහනම් පිරමීඩාකාර යෝජනා ක්‍රමයක් වශයෙන් නිශ්චය කර ඇති ONMAXDT යෝජනා ක්‍රමයට සම්බන්ධ පුද්ගලයන්ගේ අත්අකුරු පරීක්ෂණ සිදු කිරීම.
4. ඩුබායිහි සැඟව සිටිව මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය වන පුද්ගලයන් හඳුනාගැනීම සඳහා වන පරීක්ෂණ සිදු කිරීම.
5. පරිභෝජනයට නුසුදුසු නිසා විනාශ කිරීමට නියෝග කර තිබූ ෆාම් ඔයිල් විනාශ නොකර පරිභෝජනයට යොමු කිරීම සම්බන්ධ දූෂණයට අදාල අත්අකුරු හා අත්සන් පරීක්ෂණ සිදු කිරීම.

අධිකරණ මස්තු විද්‍යා හා ඩී. එන්. ඒ. විද්‍යාගාරය.

1. හලාවත ප්‍රදේශයේ සිදු වූ සමූහ අභිරහස් ඝාතනය සම්බන්ධයෙන් වන පරීක්ෂණයේදී මියගිය පුද්ගලයින්ගේ අනන්‍යතාව සොයාගැනීම හා ආගන්තුක පුද්ගලයින් සිදුවීමට මැදිහත් වී ඇතිදැයි පරීක්ෂා කිරීමට ස්ථානීය පරීක්ෂණයක් සිදු කර DNA විශ්ලේෂණය සඳහා සාම්පල් ලබා ගැනීම.

2. මීගමුව ප්‍රදේශයෙහි සිදු කරන ලද වංචා හා දූෂණ කිහිපයකට සම්බන්ධ පුද්ගලයෙකු තම අනන්‍යතාවය වසන්වන ආකාරයට සාදාගන්නා ලද විදේශ ගමන් බලපත්‍රයක් මඟින් රහසිගතව ඩුබායි රාජ්‍යය වෙත විදේශගතව ඇති අතර, එහිදී කිසියම් වූ සිදුවීමකින් මරණයට පත්ව ඇත. එම මියගිය පුද්ගලයාගේ බිරිඳහට ඔහු විසින් සිදුකරන ලද වංචා හා දූෂණ වලට පිළිතුරු බැඳීමට සිදුව ඇති පසුබිමක ඔහුගේ යැයි සැකකරනු ලබන ශරීර කොටස් මෙරටට එවා ඇති අතර අදාල උසාවි නියෝගයට අනුව, ඩී.එන්.ඒ. පරීක්ෂණයක් මඟින් පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා එම ශරීර කොටස් සහ ඔහුගේ දියණිය, මව, බිරිඳ යන අයගේ ජෛව සාම්පල ද ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙහි ඩී.එන්.ඒ. අංශය වෙත යොමුකර ඇත.

ඩී.එන්.ඒ. විශ්ලේෂණයෙන් අනාවරණය වූ කරුණුවලට අනුව ඩුබායි රාජ්‍යයේ සිට එවන ලද ශරීර කොටස් වලට අදාල පුද්ගලයා පිරිමි පුද්ගලයෙකු බවට හඳුනාගනු ලැබූ අතර ඔහු මෙම නඩුවට අදාලව අප වෙත යොමු කරන ලද දියණියගේ ජීව විද්‍යාත්මක පියා බවටත් එම මවගේ ජීව විද්‍යාත්මක පුතා බවටත් තහවුරු විය.

03. මාතර රෝහලෙහි උපත ලද බිළිඳකු උපතේදීම මියගොස් ඇති අතර මව හෝ ඥාතීන්හට මියගිය බිළිදා නොපෙන්වා භූමිදානය කළ බව දන්වා ඇත. මෙහිදී මව සහ අදාල ඥාතීන් විසින් මියගිය බිළිදා නොපෙන්වා භූමදානය කිරීම පිළිබඳව විමසා එයට විරුද්ධව කරන ලද පැමිණිල්ලකට අනුව කරන ලද විමර්ෂණයේදී මියගිය බිළිදාගේ බවට සැකකරනු ලබන මළ සිරුරක් අපද්‍රව්‍ය බැහැර කිරීමට යොදා ගනු ලබන ලොරි රථයක තිබී සොයා ගන්නා ලද අතර එය උසාවි නියෝගයක් මඟින් අනන්‍යතාවය තහවුරු කිරීම ආණ්ඩුවේ රස පරීක්ෂක දොපර්තමේන්තුවේ ඩී.එන්.ඒ. අංශය වෙත යොමු කරන ලදී. මෙහිදී මියගිය බිළිදාගේ යැයි සැකකරනු ලබන පැමිණිලි පාර්ශවයෙහි මව සහ පියාගේ ජෛව සාම්පල ද යොමු කරන ලද අතර ඩී.එන්.ඒ විශ්ලේෂණය මඟින් අනාවරණය වූ කරුණු වලට අනුව අපද්‍රව්‍ය බැහැර කරනු ලබන ලොරි රථයේ තිබී සොයාගන්නා ලද බිළිදු මළ සිරුර පැමිණිලි පාර්ශවයේ මව සහ පියාගේ ජෛව විද්‍යාත්මක දරුවා බවට අනාවරණය විය.

04. මැදිරිගිරිය පොලිස් වසමෙහි කැබ්රියක් තුලදී ගිණිතබා ඝාතනය කරන ලද පුද්ගල මළසිරුරක් හමුව ඇති අතර, එම මියගිය පුද්ගලයාගේ ශරීර කොටස් ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ඩී.එන්.ඒ. අංශය වෙත පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා යොමුකර ඇත. මෙහිදී එම මියගිය පුද්ගලයාගේ අතුරුදහන් වීමට අදාල පරීක්ෂණ කටයුතු වලට අනුව පොලිසිය විසින් සොයාගනු ලැබූ එම පුද්ගලයාගේ බවට සැකකරනු ලබන ඔහුගේ දරුවන් සහ බිරිඳගේ ජෛව සාම්පලද ඩී.එන්.ඒ. පරීක්ෂණ කටයුතු සඳහා යොමු කර ඇත. අදාල ඩී.එන්.ඒ. පරීක්ෂණ මඟින් අනාවරණය වූ කරුණු වලට අනුව, එම කැබ්රථයේ තිබී හමුවූ පිළිස්සුණු ශරීර කොටස් ඉදිරිපත් කරන ලද දරුවන්ගේ ජීව විද්‍යාත්මක පියාගේ බවට තහවුරු විය.

ධූලක විද්‍යා අංශය

01. මාලඹේ ප්‍රදේශයේ නීතිවිරෝධීව පවත්වාගෙන ගිය මත්ද්‍රව්‍ය නිෂ්පාදනාගාරයේ සිදු වූ රසායනික ද්‍රව්‍ය කාන්දුව නිසා පුද්ගලයින් දෙදෙනකු මරණයට පත්වීමේ සිද්ධියේ ස්ථානීය පරීක්ෂාව සිදුකර වායු සාම්පල විශ්ලේෂණය සිදුකිරීම හා අදාල පුද්ගලයින්ගේ ජෛව සාම්පල (Biological Samples) පරීක්ෂා කිරීම හා ඒවායේ ඇතුළත් මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම.

02. මුහුදේ, ධීවර යාත්‍රාවක සිටි ධීවරයින් පස්දෙනකු පාවෙමින් තිබූ බෝතලයක අඩංගු වූ, දියරයක් පානය කිරීමෙන් එම අයගෙන් හතර දෙනකු ජීවිතක්ෂයට පත් වූ අතර එක් අයකු දිවි ගලවාගෙන තිබුණි. එම සිද්ධියට අදාල ධීවරයින්ගේ ජෛව සාම්පල විශ්ලේෂණය කරන ලදි.

පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය

01. 11 කණුව, කරදගොල්ල, ඇල්ල ලිපිනයේ පිහිටි නිවසක් ගිනි ගැනීම හා එම නිවසේ හිමිකරු එම ගින්නට හසුවී මියයාම පිළිබඳ විමර්ශනය 2024.03.11 දින සිදු කරන ලද අතර එහිදී මෙම නිවසේ ඇති වූ ගින්න පෙට්‍රල් යොදා හිතා මතා ගිනි තැබීමෙන් ආරම්භ වී ඇති බව තහවුරු කර ගන්නා ලදී.

02. කොළඹ 07, ශ්‍රී ලංකා පදනම් මාවතේ, අංක 100 දරන ස්ථානයේ පිහිටි අග්‍රා අවන්හල ගින්නෙන් හානි වීම පිලිබඳ විමර්ශනය 2024.06.30 දින සිදු කල අතර එහිදී එම ගින්න අවන්හලේ මුළුතැන්ගෙයි කෑම පිසින අවස්ථාවේ දී එහි තිබූ ගෑස් සිලින්ඩරයක රෙගියුලේටරය හා සම්බන්ධ රබර් නලය නිසියාකාරව එම රෙගියුලේටරයට සවි වී නොතිබීම හේතුවෙන් හෝ එම රෙගියුලේටරයට සමීප පෙදෙසක රබර් නලය පළුදු වීමකින් ද්‍රව පෙට්‍රෝලියම් වායුව කාන්දුවී එම වායුව උඳුනේ ගිනි දැල්ලෙන් ජ්වලනය වීමෙන් ආරම්භ වී ඇති බව තහවුරු කර ගන්නා ලදී.

03. මීගමුව පාර, බඩල්ගම, බියට්‍රිස් වත්ත ලිපිනයේ පිහිටි හේලීස් පුද්ගලික සමාගමට අයත් "හේකාබ්" කර්මාන්ත ශාලාවේ බොයිලේරුවක් පිපිරීම හේතුවෙන් එක් පුද්ගලයෙකු මරණයට පත්වී තවත් පුද්ගලයන් 18 දෙනෙකු තුවාල ලබා රෝහල් ගත කිරීමේ සිදුවීමට අදාල විමර්ශනය 2024.10.15 දින සිදුකිරීමේදි එහි සක්‍රිය කාබන් නිපදවීම සඳහා හුමාලය ලබා ගන්නා බොයිලේරුවේ පීඩනය අධික ලෙස ඉහල යාම හේතුවෙන් එම පිපිරීම සිදුව ඇති බව තහවුරු කර ගන්නා ලදී.

04. අංක 87/05, සිංහපුර පාර, හලාවත ලිපිනයේ නිවැසියන් යැයි සැක කල හැකි දැවී ගිය සිරුරු සහිත ගිනි ගත් නිවස 2024.10.20 දින විමර්ශනය කිරීමේ දී එම නිවසේ වූ ගිනි ගැනීම් හිතා මතා සිදු කල ඒවා බවට නිගමනය කරන ලදී.

05. රම්බොඩ, රම්බොඩ වත්ත පිහිටි කවිදාස් ඉඩමට සතුන් ඇතුල්වීම වැළැක්වීම සඳහා ඇද තිබූ විදුලි වැටේ එහි සේවකයෙකු වන තංගවේල් ක්‍රිෂ්ණකුමාර් දැවවීමෙන් විදුලි සැර වැදී මිය යාම සම්බන්ධව විමර්ශනය 2024.12.04 දින සිදු කරන ලද අතර එහිදී එම විදුලි වැටට සූර්ය පැනල, බැටරි, අධි වෝල්ටීයතා ජනකයක් හා ස්පන්ධ ජනකයක් (Pulse maker) භාවිතා කොට අධි වෝල්ටීය සරල විදුලි ධාරාවක් ලබා දී තිබූ බවත් එම ස්පන්ධ ජනකයේ සංඛ්‍යාතය මිනිසෙකු මියයාමට තරම් ප්‍රමාණවත් ධාරාවක් උත්පාදනය කරන බවත් තහවුරු කර ගන්නා ලදී.

<u>04. පොදු කරුණු</u>

- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙහි ප්‍රශස්ත ලෙස ක්‍රියාකිරීමට හැකි පරිසරය වැඩි දියුණු කිරීම.
- විශ්ලේෂණය අවසන් කර ගත නොහැකිවූ නඩු භාණ්ඩ ප්‍රමාණය අඩුකිරීම

  විශ්ලේෂණය සඳහා දැනට එක්රැස් වී ඇති නඩු භාණ්ඩ ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට නම් විද්‍යාත්මක සේවයේ නිලධාරීන් 50ක් වත් බඳවා ගත යුතුවේ. ඒ අනුව දැනට පුරප්පාඩු වී ඇති තනතුරු 21ට අමතර තනතුරු 29 වෙනුවෙන් ඉදිරියේදී මු.රෙ 71 යටතේ අනුමැතිය ඉල්ලීම් කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂාවෙන් සිටී. එමෙන්ම අනෙකුත් කාර්ය මණ්ඩල පුරප්පාඩුද හැකි ඉක්මනින් පුරවා ගත යුතුය. මෙසේ කිරීමෙන් බන්ධනාගාර තද බදය අවම කර ගැනීමත් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමත් සිදුකල හැකිවේ.

- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් 21 දෙනෙකු ඇතුළුව 2024.12.31 දිනට සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 121 ක් පවතී.

- මෙම පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු නොකළහොත්, විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම ප්‍රමාද වීම නිසා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ප්‍රමාද වන අතර එය බන්ධනාගාර තදබදයට ද හේතු වනු ඇත. එමෙන්ම මෙය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහිද අහිතකර ලෙස බලපායි.

- 2024.12.31 දක්වා මෙම වර්ෂයේදී ලැබුණු නඩු භාණ්ඩ 64,524න් 59%ක් අවසන් කර ඇත. කෙසේ වෙතත්, මත්ද්‍රව්‍ය රසායනාගාරයට පැමිණෙන නඩු භාණ්ඩ ප්‍රමාණය විශාල ලෙස වැඩිවීම නිසා විශ්ලේෂණය නොකර ඉතිරිවන නඩු භාණ්ඩ ප්‍රමාණය වැඩිවේ. මත්ද්‍රව්‍ය රසායනාගාරයට මසකට නඩු භාණ්ඩ 2500කට අධික ප්‍රමාණයක් ලැබෙන අතර නඩු භාණ්ඩ භාර ගැනීම, විශ්ලේෂණය කර අවසන් නඩු භාණ්ඩ නැවත භාර දීම, වාර්තා සකස් කිරීම සහ වාර්තා අත්සන් කිරීම වැනි කාර්යයන් සඳහා සැලකිය යුතු කාලයක් වෙන් කිරීමට සිදුවේ. එබැවින් සාමාන්‍ය පැය 08ක වැඩ දිනයක විශ්ලේෂණය සඳහා ඉතිරිවන්නේ සීමිත කාලයක් පමණි. තවද, ඔවුන් විසින් නිකුත් කරන ලද වාර්තා සඳහා විශේෂඥ සාක්ෂි සැපයීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නිරන්තරයෙන් අධිකරණයේ පෙනී සිටීමද සිදු වේ. මෙම කරුණු හේතුවෙන් නිවාඩු දිනවල සහ සාමාන්‍ය කාර්යාල වේලාවෙන් බාහිරව කැපවී සේවය කළත් මසකට වාර්තා 1500-1750 කට වඩා සම්පූර්ණ කිරීම මත්ද්‍රව්‍ය අංශයට අභියෝගයක් විය. මෙම අංශයට අමතර නිලධාරීන් යෙදවිය යුතු බව පැහැදිලිය. ඒ අනුව වාර්තා නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා නිලධාරීගේ සහායට විශ්ව විද්‍යාල පුහුණු ශිෂ්‍යයින්ගේ සහාය ලබා ගැනීමද සිදුවිය. මේ අනුව මත්ද්‍රව්‍ය අංශය මගින් වාර්තා 2500ක් පමණ මසකදී නිකුත් කිරීමට හැකියාවක් ලැබුණි. එසේ නොමැති නම්, වැඩිවන නඩු භාණ්ඩ විශ්ලේෂණය ඵලදායී ලෙස කළමනාකරණය කළ නොහැකි වනු ඇත.

ලැබෙන නඩු භාණ්ඩ වල ප්‍රමාණය වැඩි වන විට, උපකරණ සංඛ්‍යාවද වැඩි කිරීමට සිදු වේ. ඊට සමගාමීව නිලධාරීන් සංඛ්‍යාවේ වැඩි වීමක්ද සිදුවිය යුතුයි. එපමණක් නොව, සීමිත රසායනාගාර ඉඩකඩ නිසා ගොඩනැගිලි පහසුකම් පුළුල් කිරීම ද අත්‍යවශ්‍ය වේ.

පී.එස්.කේ. රාජපක්ෂ
ආණ්ඩුවේ රස පරීක්ෂක

03 පරිච්ඡේදය

සමස්ථ මූල්‍යමය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

					ඒසීඒ-එෆ්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය					
සංශෝධිත අයවැය 2024		සටහන	තත්‍ය		
			2024	2023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		645,517,091	690,816,450	**ඒසීඒ-3**
-	තැන්පතු		81,801,317	12,099,750	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		9,493,176	11,110,429	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**736,811,584**	**714,026,629**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		736,811,584	714,026,629	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		7,046,973	2,622	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**729,764,611**	**714,024,007**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
225,835,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	222,091,249	197,726,072	
566,589,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	409,204,606	467,006,620	**ඒසීඒ-2(ii)**
2,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,533,286	1,657,669	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
794,424,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**632,829,141**	**666,390,361**	

	මූලධන වියදම්				
4,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	2,890,790	3,550,920	
686,711,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	587,385,576	162,910,813	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
16,200,000	හැකියා වර්ධනය	**14**	16,138,210	8,930,490	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
706,911,000	**මුළු මූලධන වියදම් (උ)**		**606,414,576**	**175,392,223**	
-	තැන්පතු ගෙවීම්		25,884,526	9,582,125	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගෙවීම්		9,460,938	8,217,486	**ඒසීඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**35,345,464**	**17,799,611**	
-					
-	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		1,274,589,181	859,582,195	
-					
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(544,824,570)**	**(145,558,188)**	
-					
-	**අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය**		(544,824,570)	(145,558,188)	**ඒසීඒ-7**
-	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය**		887,234	-	**ඒසීඒ-3**

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	3,266,024,462	2,715,305,272
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	19,534,186	19,566,424
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	887,234	-
මුළු වත්කම්		**3,286,445,882**	**2,734,871,696**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(39,328,350)	16,620,678
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,266,024,462	2,715,305,272
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	58,862,536	2,945,746
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	887,234	-
මුළු වගකීම්		**3,286,445,882**	**2,734,871,696**

පිටු අංක 09 සිට 29 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 56 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 චක්‍රලේඛනයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී		ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	පී.එස්.කේ. රාජපක්ෂ	නම :
තනතුර : ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන ලේකම් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.	තනතුර :	ආණ්ඩුවේ රස පරීක්ෂක ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව නො 31, ඉසුරු මාවත, පැලවත්ත බත්තරමුල්ල	ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව නො.31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල
දිනය : 28/02/2025	දිනය : 25.02.2025		දිනය : 2025/02/24

3

						ඒසීඒපී-
2024 දෙසැම්බර් 31 දිනට						
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය						
				තත්‍ය		
		සටහන		**2024**		**2023**
		-	-	රු.		රු.
මූල්‍ය නොවන වත්කම්						
දේපළ, පිරියත හා උපකරණ		ඒසීඒ-6		3,266,024,462		2,715,305,272
මූල්‍ය වත්කම්						
අත්තිකාරම් ගිණුම්		ඒසීඒ-5/5(ඒ)		19,534,186		19,566,424
මුදල් හා මුදල් සමාන දෑ		ඒසීඒ-3		887,234		-
මුළු වත්කම්				**3,286,445,882**		**2,734,871,696**
ශුද්ධ වත්කම් / ස්කන්ධය						
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්				(39,328,350)		16,620,678
දේපළ පිරියත හා උපකරණ සංචිතය				3,266,024,462		2,715,305,272
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		**ඒසීඒ-5(බී(**		-	-	-
ජංගම වගකීම්						
තැන්පතු ගිණුම්		ඒසීඒ-4		58,862,536		2,945,746
අග්‍රිම ශේෂය		ඒසීඒ-3		887,234		-
මුළු වගකීම්				**3,286,445,882**		**2,734,871,696**

3.3 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තත්‍ය	
	2024	2023
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	50,030,954	65,190,999
අග්‍රිම ලැබීම්	645,517,091	690,816,451
අත්තිකාරම් අයකර ගැනීම්	8,928,628	8,777,574
තැන්පතු ලැබීම්	23,434,931	12,099,751
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**727,911,604**	**776,884,775**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	560,878,233	663,136,768
සහනාධාර සහ මාරුකිරීම්	1,533,286	1,657,669
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	15,500,691	4,650,055
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	7,046,973	2,622
අත්තිකාරම් ගෙවීම්	9,464,938	8,217,486
තැන්පතු ගෙවීම්	25,884,526	9,582,126
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**620,308,647**	**687,246,726**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**107,602,957**	**89,638,049**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	249,556	164,345
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	249,556	164,345
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	106,965,279	89,802,394
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**106,965,279**	**89,802,394**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(106,715,723)**	**(89,638,049)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**887,234**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**887,234**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

වාර්තා කිරීමේ පදනම

1) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

*තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.01.01	රජයේ ගොඩනැගිලි කුලී	150,000	150,000	249,556.09	166%
20.03.02.99	අනෙකුත් ලැබීම්	20,000,000	20,000,000	33,901,732.00	170%
20.03.99.00	අනෙකුත් ලැබීම්	1000,000	550,000	5,483,683.60	997%
20.02.02.99	අනෙකුත් ලැබීම් (පොළිය)	750,000	750,000	1,184,629.86	158%
20.04.01.00	අනෙකුත් ලැබීම්	-	-	9,403,879.84	
20.03.01.00		-	14,000	57,029.00	407%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

වැය විෂයය	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
	වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
පුනරාවර්තන	847,500,000	794,424,000	632,829,141	79%
මූලධන	545,000,000	706,911,000	606,414,576	86%
එකතුව	1,392,500,000	1,501,335,000	1,239,243,717	82%

3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම

අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය	අරමුණ	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
			වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
අදාල නැත.						

3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය

වත්කම් කේතය	ජංගම නොවන වත්කම්	භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ 2024.12.31 දිනට ශේෂය	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ 2024.12.31 දිනට ශේෂය	තවමත් ගණන් ගත යුතු	වාර්තා ගත ප්‍රගතිය % ලෙස
9151	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1,150,546,868	1,150,546,868	-	100
9152	2.1 මෝටර් රථ වාහන	124,506,796	124,506,796	-	100
9152	2.2 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1,907,970,799	1,907,970,799	-	100
9153	ඉඩම්	83,000,000	83,000,000	-	100
9154	මූල්‍ය නොවන වතකම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	නොනිමි වැඩ	-	-	-	-
9180	කල්බදු වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/F/GAD/FS/02/2024

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 30 දින

ආණ්ඩුවේ රස පරීක්ෂක

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹුකරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරබවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

3

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

(අ) සමාලෝචිත වර්ෂයේ භෞතික වත්කම් විකිණීමෙන් ලද වටිනාකම ලෙස රු.249,556ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ඇතුළත්කර තිබුණ ද, සත්‍ය ලෙස වත්කම් විකිණීමෙන් ලද මුදල රු.57,029කි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ භෞතික වත්කම් විකිණීමෙන් ලද මුදල් ලෙස රු.192,527ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් නොවන ලැබීම් රු.50,030,954ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත්කර තිබුණ ද, දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුමට අනුව ආදායම් නොවන ලැබීම් රු.50,223,481ක් විය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම් රු.192,527 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.560,878,233ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත්කර තිබුණ ද, දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.564,995,925ක් විය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.4,117,692ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.3 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ වත්කම් අත්පත්කර ගැනීම සඳහා දරන ලද වියදම රු.106,965,279ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණ ද, දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව එම අගය රු.102,847,587ක් විය. ඒ

අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් මිලදීගැනීම සඳහා වැය කරන ලද මුදල රු.4,117,692ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි.

1.6.4 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

දෙපාර්තමේන්තුව විසින් වැය ශීර්ෂය 253 (253-1-2-4-1502-12) වෙනුවෙන් දරන ලද රු.190,730ක මුදල අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙහි (ACA-7) අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් දරන ලද වියදම්වලට ඇතුළත්කර නොතිබුණි.

1.6.5 මූල්‍ය නොවන වත්කම්

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම්වල (ACA – 6 ආකෘතිය) 2023 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වත්කම් කාණ්ඩ හතරක අවසාන ශේෂයන් සහ 2024 ජනවාරි 01 දිනට දක්වා ඇති එම වත්කම් කාණ්ඩවල ආරම්භක ශේෂයන් අතර රු.466,900,603ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ACA 2(ii) හි මූලධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා දරන ලද වියදම රු.529,019,190ක් වන අතර, ACA 6 ආකෘතිය අනුව වර්ෂය තුළ වත්කම් මිලදීගැනීම සඳහා දරන ලද වියදම රු.83,818,587ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් අත්පත්කර ගැනීමට දරන ලද වියදමෙහි රු.445,200,603ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කරන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය, වත්කම්වල වටිනාකමෙන් ඉවත්කර නොතිබීම නිසා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂය අවසාන දේපල පිරියත හා උපකරණ ශේෂයෙහි හා දේපල පිරියත හා උපකරණ සංචිතයෙහි නිවැරදි අගය පෙන්නුම් නොකෙරිණි.

1.6.6 මූල්‍ය වත්කම්

දෙපාර්තමේන්තුවේ පොත් අනුව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂය රු.19,545,764ක් වූ අතර, එම ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 52) අනුව රු.19,566,424කි. ඒ අනුව ආරම්භක ශේෂ අතර රු.20,660ක වෙනස වර්ෂය අවසානයේදී ද දක්නට ලැබුණි.

5

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 13ක් සඳහා වෙන්කරන ලද රු.223,724,435ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, වැය විෂයයන්වල එසේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 10 සිට සියයට 57 අතර පරාසයක් ගෙන තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළව ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්,එසේ නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය අතර වෙනස ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට (44) සිට සියයට 140 දක්වා පරාසයක පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි විසින් අයවැය ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙලකර, සලසා ඇති ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණයකර ගැනීමට කටයුතු කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 16ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන්ට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කළ රු.115,036,000ක ප්‍රතිපාදන මාරුකර තිබූ අතර, වැය විෂයයන් 4ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.108,835,000ක් ලබාගෙන තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරුකිරීමේ ප්‍රතිශතය සියයට 5 සිට සියයට 140 අතර පරාසයක් ගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.10,500,000ක් මාරුකර තිබූ අතර, එලෙස මාරුකරගත් ප්‍රතිපාදන උපයෝජනය නොකර රු.2,634,639ක් එනම් සියයට 11 සිට සියයට 60 දක්වා ඉතිරි වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයෙහි 233-1-1-1-2103(17) යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම මඟින් ලබාගත් ප්‍රතිපාදන

6

රු.70,000,000න් උපයෝජනය නොකර රු. 15,292,908ක් එනම් සියයට 22ක් ඉතිරි වී තිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i) තුළ බැරකම් ලෙස රු.3,396,209ක් සඳහන්කර තිබුණ ද, ආයතනයේ බැරකම් ලේඛනයෙහි එම අගය රු.3,506,872ක් විය. ඒ අනුව, බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i) තුළ බැරකම් රු.110,663ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදයට අනුව බැදීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි යාවත්කාලීනකර ඇති සිගාස් ගිණුම්කරණ පද්ධතියට බැදීම් හා බැරකම්වලට අදාළ ගනුදෙනු සම්බන්ධ ක්‍රියාවලියේ සියලුම පියවරයන් ඇතුළත් කළ යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i)හි රු.3,396,209ක බැරකම්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 92) තුළ ඇතුළත්කර නොතිබුණි. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා බැරකම් ප්‍රකාශනය අතර රු.3,396,209ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 92) තුළ ඇතුළත් නොවූ රු.7,264,125ක් වූ බැරකම් 2025 වර්ෂයේදී නිරවුල්කර තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ජනාධිපති ලේකම් කාර්යාල විසින් නිකුත් කළ චක්‍රලේඛ හා උපදෙස්	
	අංක CA/1/1/16/1 හා 2010 ජූලි මස 09 දිනැති චක්‍රලේඛය හා 1993/12/31 දිනැති අංක පීපීඒ/6/1/1 දරන චක්‍රලේඛය	නිලධාරීන් පස්දෙනෙකු විසින් චක්‍රලේඛය පරිදි වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
	(i) XV පරිච්ඡේදයෙහි 10.3 වගන්තිය	චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් සහිත විදේශ නිවාඩු ලබා රටින් බැහැරවීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය, අඩුම වශයෙන් නිලධාරියා රටින් පිටවීමට දින 10කට කලින් ඉදිරිපත් කළ යුතු වුව ද, එංගලන්තයේ ලින්කොල්න් (LINCOLN) විශ්ව විද්‍යාලයේ 2024 සැප්තැම්බර් 20 සිට 2025 සැප්තැම්බර් 16 දක්වා කාලපරිච්ඡේදය සඳහා පශ්චාත් උපාධිය හැදෑරීමට වැටුප් සහිත නිවාඩු ලබා ගත් ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරියකට සමාලෝචිත වර්ෂය තුළදී අදාළ නිවාඩු අනුමතකර ගැනීමට නොහැකි වී තිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	

8

(i) මුදල් රෙගුලාසි 104 (1) (අ) (2)	දෙපාර්තමේන්තුවට අයත් මෝටර් වාහන හතකට අදාළව සිදු වී තිබුණු හදිසි අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර,සිදු වූ හානියේ වටිනාකම හෝ රක්ෂණ සමාගම විසින් ගෙවන ලද මුදල පිළිබඳ තොරතුරු අදාළ ලිපිගොනුව තුළ නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 110 (1)	හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන ගිය ද, එය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 115	පසුගිය වර්ෂවලට අදාළ ගෙවීම් කිරීම සඳහා මුදල් රෙගුලාසි 115 ප්‍රකාරව අනුමැතිය ලබා ගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ සේවා සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු ඒ ඒ වර්ෂවල ලද වහාම රජයේ ආදායමට බැරකර තිබුණ ද, එයින් නිලධාරීන්ට අදාළ දීමනාව ගෙවීමේදී පසුගිය වර්ෂවලට අදාළ මුදල් ද සමාලෝචිත වර්ෂයේදී අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.
((iv) මුදල් රෙගුලාසි 447 (1)	චක්‍රලේඛය ප්‍රකාරව පොදු 138 වැය ලෙජරයෙහි බැදී ඇති බැරකම් පිළිබඳව දක්වා නොතිබුණි.
(v) මුදල් රෙගුලාසි 447 (4) හා (5)	චක්‍රලේඛය ප්‍රකාරව සියලු බැරකම් ඒවා සිදු වූ විගස ගිණුමේ වම් පැත්තේ සටහන් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව බැරකම් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි.
(vi) මුදල් රෙගුලාසි 1645 (අ)	වාහන වෙනුවෙන් 267 වැනි පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් නිසිපරිදි යාවත්කාලීනකර පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(viii) මුදල් රෙගුලාසි 1646	දෙපාර්තමේන්තුවට අයත් වාහන 24ක් සඳහා ධාවන සටහන් හා මාසික වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 2.11.3 (අ) වගන්තිය	ප්‍රසම්පාදන සහ තාක්ෂණ ඇගයීම් කමිටුවල වාර්තා ප්‍රසම්පාදන අත්පොතේ අඩංගු නිශ්චිත ආකෘතියට අනුව වාර්තා කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ වාහන අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන කටයුතුවලදී තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා අදාළ ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත්කර නොතිබුණි.

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i) 2024 ජුනි 07 දිනැති අංක 14/2022 (IV) දරන චක්‍රලේඛයේ 2.9 වගන්තිය	රාජ්‍ය නිලධාරින්ට වැටුප් රහිත දේශීය/විදේශීය නිවාඩු ලබාදීමේදී අදාළ අයදුම්පත්‍රය නිවාඩුව ආරම්භ වන දිනට අවම මාස තුනකට පෙර කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන් දෙදෙනෙකු විසින් නිවාඩු ආරම්භවීමට සති දෙකකට පෙර නිවාඩු ඉල්ලුම්කර තිබුණි.
(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාහන 22කට අදාළව ඉන්ධන පරීක්ෂාවක් සමාලෝචිත වර්ෂයේදි සිදුකර නොතිබුණි.

(ඊ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

2016 අගෝස්තු 02 දිනැති අංක PF/R/04/08/01(13) දරන ලිපිය	දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ නිලධාරින් සිය සේවා කාලයෙන් පරිබාහිරව ඉටුකරනු ලබන සේවාවන් වෙනුවෙන් ලබාගන්නා ගාස්තුව, වසර 03කට වරක් සමාලෝචනය කර නිසිපරිදි සංශෝධනය කිරීමට පියවර ගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ

10

	අනුමතකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයම සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගෙන තිබුණි.
(උ) 2017 ජුනි 28 දිනැති චක්‍රලේඛ කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 7 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.5 තැන්පතු

සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන තැන්පතු (අංක 11-604) ලෙස තැන්පත් කරන ලද රු.58,366,386ක් තැන්පතු ලෙජරයේ සටහන්කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යයසාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) 2024 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය තුළදී සංශෝධනය කර තිබුණ ද, ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12(අ) ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා විශේෂඥ දීමනා ලැබීම් ලෙස රුපියල් මිලියන 20ක් ඇස්තමේන්තුකර තිබූ අතර, සත්‍ය වශයෙන් රුපියල් මිලියන 34ක් ලැබී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුව නිසියාකාරව පිළියෙල නොකිරීම හේතුවෙන් සත්‍ය ලැබීම් සියයට 170කින් වැඩි වී තිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී දෙපාර්තමේන්තුවේ අධිකරණ විද්‍යා අංශයට හා ආහාර විද්‍යා අංශයට පරීක්ෂණයට භාජනයකර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා පිළිවෙළින් නඩු භාණ්ඩ 16,237ක් සහ 1,585ක් තිබුණු අතර, වර්ෂය තුළදී පිළිවෙළින් නඩුභාණ්ඩ 44,172ක් සහ 20,352ක් ලැබී තිබුණි. මින් වර්ෂය තුළදී අධිකරණ විද්‍යා අංශය විසින් නඩුභාණ්ඩ 33,446ක් ද, ආහාර විද්‍යා අංශය නඩු භාණ්ඩ 18,680ක් ද, විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට අධිකරණ විද්‍යා අංශයට හා ආහාර විද්‍යා අංශයට පිළිවෙළින් නඩුභාණ්ඩ 26,963ක් සහ 3,257ක්, එනම් සියයට 45ක් සහ සියයට 15ක් විශ්ලේෂණයකර වාර්තා ඉදිරිපත් කිරීමට ඉතිරි වී තිබුණි.

(ආ) විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීමට තිබූ නඩුභාණ්ඩ 30,220න් නඩුභාණ්ඩ 4,028ක් එනම් සියයට 13ක් 2017-2023 කාලපරිච්ඡේදයට අදාළ පැවතුණි.

(ඇ) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව වාහන මිලදීගැනීමට රු.2,000,000ක් වෙන්කර තිබුණ ද, වර්ෂය තුළදී රු.1,052,139ක් පමණක් වැයකර තිබූ අතර, ඒ අනුව සියයට 47ක් ඇස්තමේන්තු මුදලින් ඉතිරි වී තිබුණි.

(ඉ) ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා රු.100,000,000ක් ඇස්තමේන්තු කර තිබූ අතර, වර්ෂය තුළදී මින් රු.42,836,328ක මුදලක් වැයකර තිබූ අතර, ඒ අනුව සියයට 57ක මුදලක් ඉතිරිවී තිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයෙහි 2.3, 3.3.1 සහ 4.3 ඡේද ප්‍රකාරව සෑම වර්ෂ 05කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා නැවත තක්සේරුවක් සිදුකළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් එසේ කිරීමට කටයුතුකර නොතිබුණි.

12

4.3 රජයේ නිලධාරීන් ඇපකැබීම

රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳව 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරීත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින්, නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන් කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත්කර නොතිබුණි.

4.4 පාඩු හා හානි

2003 පෙබරවාරි 14 දින සිදු වූ ගිනි අනතුරු අලාභය රු.2,229,111ක් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, එය පොත්වලින් කපාහැරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතුකර නොතිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) දෙපාර්තමේන්තුව සතු මෝටර් වාහන හතක අනතුරුවලට අදාළ අලුත්වැඩියා කටයුතු රක්ෂණාවරණය යටතේ සිදුකිරීමට අයදුම්පත් යොමුකර තිබුණ ද, මෙම අලුත්වැඩියාවන් නියම වශයෙන් සිදුකළ බව, රක්ෂණ සමාගම විසින් අදාළ සම්පූර්ණ වටිනාකම ගෙවූ බව හෝ අනතුරට අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් යම් මුදලක් අයකර ගත යුතු ද නැද්ද යන්න පිළිබඳ කිසිදු තොරතුරක් වාහන අනතුරු ලිපිගොනු තුළ ඇතුළත්කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේදී ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතුව තිබූ රු.85,861ක ආපදා ණයශේෂය, වැඩ තහනම් කර ඇති නිලධාරිනියකගෙන් වසර 10කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.18,754ක ආපදා ණයශේෂය සහ නිලධාරියකුගෙන් වසර 03කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.2,400ක විශේෂ අත්තිකාරම් ණයශේෂය සහ2023 ජූලි මස 06 දින සිට සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.222,950ක ආපදා ණයශේෂය හා රු.7,500ක උත්සව අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී KOICA ප්‍රදානයක් ලෙස දෙපාර්තමේන්තුවට ලැබී තිබූ IBM Storwize V3700 වර්ගයේ උපකරණය තුළ 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය මගින් නිකුත්කර ඇති පරීක්ෂණ වාර්තාවලට අදාළ දත්ත ගබඩාකර තිබුණි. මෙම උපකරණය සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේදී ක්‍රියා

13

විරහිත වී තිබූ අතර, මේ හේතුවෙන් මෙම Storage Server උපකරණය තුළ ගබඩාකර තිබූ දත්ත නැවත ලබාගැනීමට නොහැකි තත්ත්වයක් මතුවී ඇති අතර, එම උපකරණය වර්ෂය තුළදී නැවත අලුත්වැඩියා කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ඉටුකිරීමෙ ප්‍රගතිය

දෙපාර්තමේන්තුව විසින් තිරසාර සංවර්ධන අරමුණක් හඳුනාගෙන ඒ සඳහා ඉලක්කයන් ද හඳුනාගෙන තිබූ අතර, එම ඉලක්ක ළඟාකර ගැනීමට දර්ශක පිළියෙළ කර තිබුණි. ඒ අනුව පෙර වර්ෂවල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/ සාම්පල/ පරීක්ෂණවලට අදාළ විශ්ලේෂණ වාර්තා ප්‍රවර්ථන වර්ෂය තුළ නිකුත්කර අවසන් කිරීම ඉලක්ක කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙසේ විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීමට තිබූ නඩුභාණ්ඩ 30,220න් නඩුභාණ්ඩ 4,028ක් එනම් සියයට 13ක් 2017-2023 කාලපරිච්ඡේදයට අදාළ බව නිරීක්ෂණය විය.

6. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

දෙපාර්තමේන්තුව පිළිබඳව තොරතුරු බාහිර පාර්ශ්වයන්ට ලබාගැනීමට වෙබ් අඩවියක් නිර්මාණය කර තිබුණ ද, එය සමාලෝචිත වර්ෂය තුළදී යාවත්කාලීන කර නොතිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

7.1 අනුයුක්ත කාර්යය මණ්ඩලය, තථ්‍ය කාර්යය මණ්ඩලය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	92	33
තෘතියීක මට්ටම	10	4	6
ද්විතීක මට්ටම	136	70	66
ප්‍රාථමික මට්ටම	84	67	17
එකතුව	355	233	122

ආයතනයේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට උපකාරීවන තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 33කගේ, තෘතියීක මට්ටමේ නිලධාරීන් 6කගේ තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන නඩුභාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත් කරන විද්‍යාත්මක වාර්තා මාස තුනක කාලයක් ඇතුළත ලබාදීමට බාධාවක් වී තිබුණි.

යූ.එන්. අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට(වැ.බ)

15

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තු කාර්යසාධන දර්ශක

දර්ශකය	2024 වර්ෂයේ ඉලක්ක	සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස
• වර්ෂය තුළ ඉදිරිපත් වන නඩු භාණ්ඩ/සාම්පල/පරීක්ෂණ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර අවසන් කිරීම.	90%	101%
• පෙර වර්ෂ වල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/සාම්පල/පරීක්ෂණ වලට අදාල විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම.	100%	114%
• විද්‍යාගාර 02ක් නවීකරණය කිරීම.	100%	100%
• මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ධාරිතා සංවර්ධනය	100%	67%

05 පරිච්ඡේදය

සුහුරු සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම පිළිබඳ ප්‍රගතිය

අරමුණ	ඉලක්කය	ලඟා කර ගැනීමේ දර්ශක	නිවැරදි දිනට ලඟාකර ගැනීමේ ප්‍රගතිය
සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන 2030 වර්ෂය වන විට නීතිය හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා නඩු භාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත් කරන විද්‍යාත්මක වාර්තා මාස 03ක කාලයක් තුල ලබාදීමට කටයුතු කිරීම.	තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුලත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම.	• වර්ෂය තුළ ඉදිරිපත් වන නඩු භාණ්ඩ/ සාම්පල/පරීක්ෂණ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර අවසන් කිරීම.	101%
		• පෙර වර්ෂ වල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/සාම්පල /පරීක්ෂණ වලට අදාල විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම.	114%
		• අපරාධ ස්ථාන පරීක්ෂාවට අදාල වාර්තා නියමිත කාලය තුළ නිකුත් කිරීම.	100%
		• විද්‍යාගාර 02ක් නවීකරණය කිරීම.	100%
		• මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ධාරිතා සංවර්ධනය	67%

මානව සම්පත් කළමනාකරණය හා පරිපාලනය

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය

සේවක කාණ්ඩ මට්ටම	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	92
තෘතීය මට්ටම	10	4
ද්විතීය මට්ටම	136	70
ප්‍රාථමික මට්ටම	84	67
එකතුව	**355**	**233**

6.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත

තනතුර		සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව			දැනට සිටින සේවක සංඛ්‍යාව				පුරප්පාඩු
					ස්ථිර	කොන්ත්‍රාත්	අනියම	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම	වෙනත් (බැ ලෙස)	
1	ආණ්ඩුවේ රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	1	-	-	1	-	-	-	0
2	ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	2	-	-	1	-	-	1	0
3	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක	SLSS	Sp.	SL 3	1	-	-	-	-	-	1	1
4	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	SLSS	I	SL 1	8	-	-	2	-	-	4	6
5	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක	SLSS	I	SL 1	2	-	-	1	-	-	1	1
6	අධ්‍යක්ෂ (පරිපාලන) ශ්‍රී.ල.ප.සේ.1 පන්තිය	SLAS	I	SL 1	1	-	-	0	-	-	1	1
7	ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ.1 පන්තිය	SLAcS	I	SL 1	1	-	-	1	-	-	-	0
8	අභ්‍යන්තර විගණක	SLAcS	II/III	SL 1	1	-	-	0	-	-	-	1
9	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක/සහකාර රස පරීක්ෂක	SLSS	II/III	SL 1	93	-	-	77	-	-	-	16
10	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ පරීක්ෂක/සහකාර පරීක්ෂක	SLSS	II/III	SL 1	14	-	-	9	-	-	-	5
11	ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. 111 පන්තිය	SLAcS	II/III	SL 1	1	-	-	0	-	-	-	1
	ජ්‍යෙෂ්ඨ මට්ටම එකතුව				**125**	-	-	92	-	-	8	32
12	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී (අධි පන්තිය)	SLTS Supra	Sp.	MN -7	5	-	-	0	-	-	-	5
13	පරිපාලන නිලධාරී	PMAS Supra	Sp.	MN -7	1	-	-	1	-	-	-	0
14	භාෂා පරිවර්තක සේවය	TS	III	MN -6	2	-	-	2	-	-	-	0
15	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (2 පන්තියේ 11/1 ශ්‍රේණිය)	SLICTS	II	MN -6	2	-	-	1	-	-	-	1
	තෘතීය මට්ටම එකතුව				**10**	**0**	**0**	**4**	**0**	**0**	**0**	**6**
16	පර්යේෂණ නිලධාරී	Dept	I/II/III	MN -4	1	-	-	1	-	-	-	0
17	සංවර්ධන නිලධාරී	DOS	I/II/III	MN -4	22	-	-	9	-	-	-	13

18	පුස්තකාලයාධිපති	SLGLS	I/II/III	MN -3	1	-	-	0	-	-	-	1
19	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී	Dept	I/II/III	MN -3	50	-	-	32	-	-	-	18
20	කාර්මික නිලධාරී	Dept	I/II/III	MN -3	1	-	-	0	-	-	-	1
21	කළමනාකරණ සේවා නිලධාරී	MSO	I/II/III	MN -2	36	-	-	20	-	-	-	16
22	යතුරු ලේඛක	Dept	I/II/III	MN -2	15	-	-	5	-	-	-	10
23	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන සහකාර	SLICTS	I/II/III	MT-1	10	-	-	3	-	-	-	7
	ද්විතීය මට්ටම එකතුව				**136**	**0**	**0**	**70**	**0**	**0**	**0**	**66**
25	රියදුරු සේවය	DS	Sp/I/II/III	PL-3	21	-	-	18	-	-	-	3
26	රසායනාගාර සහායක	Dept	I/II/III	PL-2	12	-	-	3	-	-	-	9
27	ගොඩනැගිලි නඩත්තු සහායක	Dept	I/II/III	PL-2	2	-	-	0	-	-	1	2
28	පුස්තකාල සහායක	Dept	I/II/III	PL-2	1	-	-	1	-	-	-	0
29	කාර්යාල සේවක සේවය	OES	Sp/I/II/III	PL-1	38	-	-	35	-	-	-	3
30	විද්‍යාගාර ඕඩර්ලි	Dept	I/II/III	PL-1	10	-	-	10	-	-	-	0
	ප්‍රාථමික මට්ටම එකතුව				**84**	**0**	**0**	**67**	**0**	**0**	**1**	**17**
	මුළු එකතුව				**355**	**0**	**0**	**233**	**0**	**0**	**9**	**121**

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු හා විදේශීය පුහුණු

අංකය	නිලධාරියාගේ නම	තනතුර	පුහුණු වැඩසටහන	ආයතනය - රට	කාල සීමාව
1	එස්.එම්.ඩී.වී.මාලා	රජයේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Management of Pesticides and their Residues from the protection of Food Crops - ITEC	ITEC – In India	2024.01.16 – 2024.01.29
2	එල්.ඒ.ඩබ්.කේ.දහනායක	රජයේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Analysis of Petroleum and its Allied Products	ITEC – In India	2024.02.05 – 2024.02.23
3	පී.එස්.කේ.රාජපක්ෂ	රජයේ අතිරේක රස පරීක්ෂක	4th International **Symposium** of Forensic Drug Testing Lab Directors" at the Colombo plan Secretariat, Bangkok, Thailand from 29th April 2024 to 3rd May 2024.	UNODC – In Thailand	2024.04.29 – 2024.05.03
4	එම්.ඒ.කේ.කේ.පී.පෙරේරා	රජයේ නියෝජ්‍ය රස පරීක්ෂක	Inter country Workshop on Enhancing Participation in CODEX Activities	WHO – In India	2024.06.23 – 2024.06.29
5	දීපිකා සෙනෙවිරත්න	රජයේ රස පරීක්ෂක	Invitational training for High level officials under the training programme, 'Strengthen Capacity Building of Forensic Drug Analysis in the Criminal Justice System in Sri Lanka' **as an invitee**	KOIKA – In Korea	2024.05.21 – 2024.05.30
6	වී.එස්.ජයසේකර	රජයේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Invitational training on Narcotic Analysis for GAD's Staff in KOREA	KOICA – In Korea	2024.09.22 – 2024.11.18
7	සී.පී.කුමාරපේලි	රජයේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
8	ඒ.එස්.සපුතන්ත්‍රී	රජයේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
9	එල්.එස්.හතුරුසිංහ	රජයේ නියොජ්‍ය රස	Invitational training on	KOICA – In	2024.11.26

		පරීක්ෂක	Toxicology Analysis for GAD's Staff in Korea (under the Project 'Strengthen Capacity Building of Forensic Drug Analysis in the Criminal Justice System in Sri Lanka – KOICA)	Korea	–
10	සී.එන්.කුලසේකර	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක			2025.01.22
11	ආර්.ඩබ්ලිව්.ආර්.කේ. රත්නායක	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක	Training programme on crime seenpreservatio on vessel for first responders at sea by UNODC GMCP	UNODC GMCP	2024.07.29-31
12	එල්.ඒ.ඩබ්ලිව්.කේ. දහනායක	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක		UNODC GMCP	2024.07.24-26
13	පී.ජී.සී.ආර්. සෙනවිරත්න	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක		UNODC GMCP	2024.07.31-08.02
14	ඩබ්ලිව්.ඒ.එච්. සංජය	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක		UNODC GMCP	2024.08.21-23
15	එම්.එම්.එස්. ප්‍රේමලාල්	පර්යේෂණ නිලධාරී		UNODC GMCP	2024.08.05 - 07
16	එච්.එන්.ඒ.පෙරේරා	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක	Chemical Analysis of Drug of Abuse and Their Precursor Chemicals	ITEC – In India	2024.12.16 – 2024.12.20
17	අයි.ඒ.එල්. ඉපලවත්ත	රජයේ සහකාර රස පරීක්ෂක			

අංකය	නිලධාරියාගේ නම	තනතුර	පුහුණු වැඩසටහන	ආයතනය - රට	කාල සීමාව
1	එස්.එල්.ආර්.ගුණවර්ධන	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක	Forensic Sciences Marsters Degree	Sungkyunkwan University in Korea	2024.02.21 – 2024.07.22
2	ටී.ආර්.එම්.සී.ඩී.මැණිකේ	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක			
3	එච්.ටී.ටී.ප්‍රියදර්ශනී	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක			
4	පී.ජී.පී.චන්ද්‍රසිරි	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක			
5	එල්.ආර්.ටී.පෙරේරා	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක			
6	ඒ.ඩී.එස්.රත්නකුමාර	රජයේ සැක කටයුතු ලේඛණ පිළිබඳ ජොෂ්ඨ සහකාර පරීක්ෂක			
7	සී.කේ.බණ්ඩාර	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක			
8	යූ.එස්.ප්‍රේමතිලක	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක			
9	ඊ.මාරසිංහ	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක	Masters in Forensic Sciences	Strathclyde University - UK	2023.09.23 – 2024.09.12
10	ඒ.සී.එස්.ධර්මරත්න	රජයේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක	Masters in Forensic	Lincoln University – UK	2024.09.20 – 2025.09.16
11	කේ.ඒ.එස්.අයි.කේ.කළුආරච්චි	රජයේ සැක කටයුතු ලේඛණ පිළිබඳ නියොජ්‍ය පරීක්ෂක	Trainer for Document Examination Workshop in the Maldives by International Organization for Migration (IMO) (As a resource person)	IMO - Maldives	2024.10.23 – 2024.10.24

අංකය	නිලධාරියාගේ නම	තනතුර	පුහුණු වැඩසටහන	ආයතනය රට -	කාල සීමාව
01	එම්.ඩී.එන්.කේ.විතාන	පරිපාලන නිලධාරී	කැබිනට් පත්‍රිකා සැකසීම	දේශීය	2024.09.13
02	එස්.කේ. කුඩච්චි	කළමනාකරණ සේවා නිලධාරී	කැබිනට් පත්‍රිකා සැකසීම	දේශීය	2024.09.13

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
1	නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන/ගිණුම් ඉදිරිපත් කර තිබුණේ?			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	ඔව්		
1.2	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	ඔව්		
1.3	වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නැත		
1.6	වෙනත් - පොදු තැන්පත් ගිණුම	ඔව්		
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම			
2.1	2018.11.21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය	ඔව්		
2.2	පුද්ගල පඩි නඩි ලේඛනය/පුද්ගල පඩි නඩි කාඩ්පත්	ඔව්		
2.3	විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.4	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.5	සිගාස් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කර මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන්නේද?	ඔව්		
2.6	ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය	ඔව්		
2.7	බඩු ලේඛන පොත	ඔව්		
2.8	තොග පොත	ඔව්		
2.9	හානි පිළිබඳ ලේඛනය	ඔව්		
2.10	බැරකම් ලේඛනය	ඔව්		
2.11	චෙක්පත් උප පත්‍රිකා ලේඛනය	ඔව්		
3	මූල්‍ය බලතල පැවරීම			
3.1	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදුකර තිබේද?	ඔව්		
3.2	මූල්‍ය බලතල පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර තිබේද?	ඔව්		
3.3	එම මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා තිබුණේද?	ඔව්		
3.4	2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන් විසින් පහත සඳහන් පාලන ක්‍රම අනුගමනය කර තිබේද?	ඔව්		
4	වාර්ෂික සැලසුම් පිළියෙළ කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර තිබුණේද?	ඔව්		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර තිබුණේද?	ඔව්		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබේද?	ඔව්		
4.4	ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර තිබේද?	ඔව්		
4.5	වර්ෂය ආරම්භයේදී එක් එක් මාසයට අදාළව අවශ්‍ය වන මුදල් අවශ්‍යතාවය ඇතුළත් මුදල් ප්‍රවාහය සැලසුම් කර එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළේද?	ඔව්		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියළුම විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළදී පිළිතුරු ඉදිරිපත් කර තිබේද?/විගණන විමසුම් නොතිබුණේද?	ඔව්		

6	අභ්‍යන්තර විගණනය			
6.1	සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර තිබුණේද? අභ්‍යන්තර විගණන විමසුම් නොතිබුණේද?	ඔව්		
6.2	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	ඔව්		
6.3	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	ඔව්		
6.4	මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කරන ලද්දේද?	අදාල නැත		
7	විගණන හා කළමනාකරණ කමිටුව			
7.1	විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට 04ක් හෝ පවත්වා තිබුණේද? සහභාගී වී තිබුණේද?	අමාත්‍යාංශයේ පැවැති රැස්වීම් 04ක් සඳහා සම්බන්ධ වී ඇත.		
8	වත්කම් කළමනාකරණය			
8.1	2017.07.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාල වෙත ඉදිරිපත් කරන ලද්දේද?	ඔව්		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත් කර ඒ බව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට දන්වා යවන ලද්දේද?	ඔව්		
8.3	2016.03.31 දිනැති අංක 05/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළේද?	ඔව්		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාල වකවානු තුළ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුවී නොතිබුණේද?	ඔව්		
8.5	මු.රෙ 772 අනුව අබලි ද්‍රව්‍ය අපහරණය කර තිබේද?	ඔව්		
9	වාහන පාලනය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද?	ඔව්		
9.2	වාහනයක් ගර්භිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කරනු ලබන්නේද? එවැනි වාහන නොතිබුණේද?	ඔව්		
9.3	සෑම වාහනයක් සඳහාම වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර තිබේද?	ඔව්		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබේද? එසේ අනතුරු සිදුවී නොතිබුණේද?	ඔව්		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර තිබේද?	ඔව්		
9.6	ලීසිං වාරික ගෙවා අවසන් වාහන වල පරම අයිතිය පවරාගෙන තිබුණේද?	ඔව්		
10	බැංකු ගිණුම් ප්‍රකාශය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා සූදානම් කර තිබුණේද?	ඔව්		
10.2	සමාලෝචන වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට පැවත එමින්	ඔව්		

	තිබුණු අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කළේද? එවැනි ගිණුම් නොතිබුණේද?			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබුණු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කර එම ශේෂ මාසයක් ඇතුලත නිරවුල් කර තිබුණේද?/එවැනි ගැලපුම් නොතිබුණේද?	ඔව්		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	වැය විෂයකට හෝ ව්‍යාපෘතියකට හෝ වැඩසටහනකට හෝ ශීර්ෂයකට සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කර තිබුණේද?	ඔව්		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණේද? එවැනි බැරකම් වලට එළඹ නොතිබුණේද?	ඔව්		
12	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම			
12.1	අදාළ අත්තිකාරම් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණේද? /පාර්ලිමේන්තුව විසින් අත්තිකාරම් කාර්යයක් පවරා තිබුණේද?	ඔව්		
12.2	හිඟහිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් පිළියෙළ කර තිබුණේද? එවැනි ශේෂ නොතිබුණේද?	ඔව්		
12.3	වර්ෂ 1කට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබුණේද? එවැනි හිඟහිටි ශේෂ නොතිබුණේද?	නැත	• රු.18,754/- ක ණය ශේෂය නඩු තීන්දුවෙන් පසුව නිරවුල් කරනු ඇත. • රු. 2,800/- ක ණය ශේෂයන් සඳහා ගෙවීම් කරන ලෙස අදාල නිලධාරීන්ට දන්වා ඇත. • වැඩ තහනමට ලක් වූ නිලධාරියකුගේ 230,450.00ක ණය ශේෂයක් ඇත.	
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබුණේද? එවැනි තැන්පතු නොතිබුණේද?	ඔව්		
13.2	පොදු තැන්පත් ලේඛනය නඩත්තු කරමින් පවතීද?	ඔව්		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළේද?	ඔව්		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කළේද? එසේ අග්‍රිම නිකුත් නොකළේද?	ඔව්		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබුණේද?	ඔව්		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා අනාවරණය වූ වෙනස්කම් මාසිකව සසඳා තිබුණේද?	ඔව්		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ විධිවිධාන වලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවා තිබුණේද?/ එසේ ආදායම් ආපසු ගෙවා නොතිබුණේද?	ඔව්		
15.2	රැස්කර තිබුණු ආදායම්, ඍජුවම ආදායමට බැරකර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැරකර හෝ තිබුණේද? එවැනි ආදායම් නොතිබුණේද?	ඔව්		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේද?	ඔව්		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය අනුයුක්ත කර/බඳවා ගෙන තිබේද?	නැත		
16.2	කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත ලිඛිත කාර්යය පැවරුම් කර තිබේද?	ඔව්		

16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යෑම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මිය යාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්යය මණ්ඩලය වෙනස් වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්යය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණේද?	ඔව්		
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැනගැනීමේ පනත පනත ප්‍රකාරව මහජනයා වෙත අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු ලබාදීම සඳහා වගකිව යුතු නිලධාරියෙක් පත්කර තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?	ඔව්		
17.2	මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීම, ලේඛන ගත කිරීමට ඒම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය දැක්වෙන ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?	ඔව්		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන ඡේද වලට අනුකූලව අර්ධ වාර් ෂිකව හා වාර් ෂිකව වාර්තා ඉදිරිපත් කර තිබේද?	ඔව්		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	2018.01.24 දිනැති අංක 05/2018 (1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන් හඳුන්වා දී ඇති පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව අමාත්‍යාංශ/දෙපාර්තමේන්ත්ව විසින් පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය පිලියෙල කර ඒය ක්‍රියාත්මක කර තිබේද?	ඔව්		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිලියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගයීම සඳහා අමාත්‍යාංශය/දෙපාර් තමේන්තුව විසින් ඒ් සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද?	ඔව්		
19	මානව සම්පත් සැලැස්ම පිලියෙල කිරීම			
19.1	2018.01.24 දිනැති අංක 02/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර තිබේද?	ඔව්	-	
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ සහතික කර තිබේද?	ඔව්		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර් ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබේද?	නැත	කාර්ය සාධන ගිවිසුම සකස් කරමින් පවතී.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කරන ලද්දේද?	ඔව්		
20	විගණන ඡේද			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත්කළ විගණන ඡේද වලින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි කර තිබුණේද? ඒවැනි විගණන ඡේද නොතිබුණේද?	ඔව්		